ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

**ஊக்கு பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான இலங்கை முகவராண்மை**

**Sri Lanka Anti-Doping Agency**

# වාර්ෂික වාර්තාව 2024

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය**

# වාර්තාව වාර්ෂික 2024

# සිංහල

# පටුන

1. ආයතනික තොරතුරු

2. දැක්ම, මෙහෙවර සහ අරමුණු

3. ප්‍රධාන කාර්ය සාධන සාරාංශය

4. සභාපතිතුමාගේ පණිවුඩය

5. අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය

6. අධ්‍යක්ෂ මණ්ඩලය - 2024

7. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

8. ආයතන ව්‍යූහය සහ කාර්ය මණ්ඩල තොරතුරු

9. මෙහෙයුම් ප්‍රගතිය

- අධ්‍යාපන හා පරීක්ෂණ අංශය
- නීති අංශය
- බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම් අංශය
- පර්යේෂණ අංශය

10. තිරසාරභාවය පිළිබඳ වාර්තාව

11. ආයතනික පාලනය

12. අවදානම් කළමනාකරණ වාර්තාව

13. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

14. මූල්‍ය වාර්තා

15. ස්වාධීන විගණනකරුවන්ගේ වාර්තාව

16. විගණන වාර්තාව 2023 සහ කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

වර්තමානයේ ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා ක්ෂේත්‍රය සීඝ්‍රයෙන් වාණිජකරණය වී තිබේ. ඒ හේතුවෙන් වර්තමාන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හුදෙක් ම ජයග්‍රහණය අරමුණු කොටගෙන ක්‍රීඩා කිරීමට යොමු වී තිබේ. මෙහි දී පවතින දැඩි තරගකාරීත්වය නිසා ම නීත්‍යානුකූල නොවන ක්‍රමවේද භාවිතා කර හුදු ජයග්‍රහණ ලබා ගැනීමට ඔවුන් පෙලඹී තිබේ.

මේ හේතුවෙන් ක්‍රීඩාවේ දී තහනම් ද්‍රව්‍ය හා ක්‍රම කරලියට පැමිණ තිබේ. ජාතික මෙන් ම ජාත්‍යන්තර ක්‍රීඩා තරග වල දී මෙම තහනම් ද්‍රව්‍ය භාවිතය තුලින් ක්‍රීඩාවේ අව්‍යාජ භාවයට හානි සිදු කරනවා සේම අවසානයේ රටක් ලෙස ජාත්‍යන්තය ඉදිරියේ අපකීර්තියට පත් ව රටේ ජවසම්පන්න මතු පරපුර සෞඛ්‍ය අතින් පරිහානියට ද පත් වේ.

ජාත්‍යන්තර මට්ටමෙන් තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා 1999ට කැනඩාවේ මොන්ට්‍රියෙල් නුවර කේන්ද්‍ර කොටගෙන ක්‍රියාත්මක වන ලෝක තහනම් උත්තේජක මර්දන ආයතනය අනුගමනය කරමින් 2013 වසර තෙක් ම ශ්‍රී ලාංකික ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ ඒ පිළිබඳව නිරූපණය කිරිම් සිදු කිරීම ක්‍රීඩා වෛද්‍ය ආයතනය මගින් සිදුවිය.

මෙම විෂය ඉටුකිරීම සඳහා ස්වාධීනව කටයුතු කරන වෙනම ම ආයතනයක අවශ්‍යතාවය ඒ වන විටත් මතුවෙමින් තිබූ බැවින් 2013 වර්ෂයේ නොවැම්බර් 18 වැනි දින දී " 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනිමට එරෙහි සම්මුති පනත " සංස්ථාපානය කෙරුණි. එම පනතේ තුන්වන කොටස යටතේ තහනම් ද්‍රව්‍ය හා ක්‍රම ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ මුලිනුපුටා දැමීම වන විෂය තේමා කර ගත් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නමින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස කටයුතු කරයි.

දැනට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස කටයුතු කරයි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රමුඛ පරමාර්ථය වනුයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩාවේ දී භාවිතා නොකළ යුතු තහනම් උත්තේජක මුලිනුපුටා දැමීම හා යහපත් පිරිසිදු භාවයෙන් යුතු ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීම යි.

# ආයතනික තොරතුරු

- **ආයතනයේ නම**
  ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

- **නෛතික ස්වරූපය**
  2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ තුන්වන කොටස යටතේ මෙම ආයතනය පිහිටුවා ඇත.

- **ආරම්භක දිනය**
  2013 වර්ෂයේ නොවැම්බර් 10 වැනි දින

- **කාර්යාලයේ ලියාපදිංචි ලිපිනය**
  363/12, සුගතදාස ස්ටේඩියම්-බ්ලොක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.

- **දුරකතන අංක**
  0113 071 838
  0112 328 366

- **විද්‍යුත් තැපැල**
  sladasl@yahoo.com

- **වෙබ් අඩවිය**
  www.antidopingsrilanka.org

- **බදු හඳුනා ගැනීමේ අංකය**
  409386822

- **විගණක**
  විගණකාධිපති

- **බැංකුකරුවන්**
  ලංකා බැංකුව

## දැක්ම

නිවැරදි හා සාධාරණ ජයග්‍රහනයක් උදෙසා තහනම් ද්‍රව්‍ය වලින් තොර ශ්‍රී ලාංකීය ක්‍රීඩා ජවයක්

## මෙහෙවර

ලෝක තහනම් උත්තේජක නීති සංග්‍රහය සහ එහි රෙගුලාසිවලට (WADA CODE) අනුකූල වන ආකාරයටක් 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත

# අරමුණු

## මූලික අරමුණ

ශ්‍රී ලංකාවේ තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කිරීමට සහය දැක්වීම.

## ද්විතීයික අරමුණු

- ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් රජයට, ක්‍රීඩා අමාත්‍යාංශය සහ ජාතික ඔලිම්පික් කමිටුව දැනුවත් කිරීම.
- **2021** ලෝක තහනම් උත්තේජක මර්දන නීති සංග්‍රහය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් ශ්‍රී ලංකාව පුරා ක්‍රියාවට නැංවීමට ප්‍රමුඛ වීම.
- ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රත්පත්තියට අනුකූල වීම සඳහා සියලුම ක්‍රීඩා සමාගම් / ආයතනවලට සහයෝගය ලබා දීම.
- වාණිජමය පදනමින් අදාළ වන ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි කලාපීය තහනම් උත්තේජක මර්දන ආයතනය ඇතුළු ව අනෙකුත් තහනම් උත්තේජක මර්දන ආයතන සමග යාවත්කාලීන වූ තහනම් උත්තේජක මර්දන භාවිතයන් සහ විශේෂඥ දැනුම බෙදා ගැනීම.
- WADA සහ NADOs ඇතුළු බලගතු උත්තේජක මර්දන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- ජාතික වැදගත්කමක් ඇති ඉහළ මට්ටමේ ක්‍රීඩා ඉසව් සඳහා විශේෂඥ තහනම් උත්තේජක මර්දනය සම්බන්ධ උපදෙස් සහ මගපෙන්වීම ලබා දීම.
- සියලු ම ප්‍රධාන ඉසව් සම්බන්ධ වගකීම් ලෝක මට්ටමේ ප්‍රමිතියට අනුව ඉටු කිරීම.
- තහනම් උත්තේජක භාවිතය වැළැක්වීම සඳහා අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ වැඩසටහනක් ලබා දීම.
- අභ්‍යන්තව හා බාහිර ව විශේෂඥයන් යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතයේ අවදානම අඛණ්ඩව ඇගයීමට ලක් කිරීම.
- නීතිය බලාත්මක කිරීම ඇතුළු ව පවතන කඳවුරු තුලින් බුද්ධි තොරතුරු රැස් කිරීම පිළිබඳ නිපුණත වැඩි කිරීම.
- ශ්‍රී ලංකාවේ ක්‍රීඩා හා අධ්‍යාපනික දර්ශනය හරහා  අධ්‍යාපනික වැඩසටහන් හරහා වැළැක්වීම මත පදනම් වූ  සාරධර්ම ශක්තිමත් කිරීම , ඉතා සුදුසු ප්‍රායෝගික මෙවලම් සහ උපකාරක සේවා වර්ධනය මගින් සහාය වීම.
- බුද්ධි තොරතුරු ප්‍රමුඛ , ජවසම්පන්න සහ ප්‍රතිග්‍රාහක පරීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරිම.
- ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහ භාවිතයන් යොදා ගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ඒකාකාර ක්‍රීඩා පිටියක් ප්‍රවර්ධනය කිරීම.

# ප්‍රධාන කාර්ය සාධන සාරාංශය

| විස්තරය | ගණන | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|
| තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කිරීම. | ගණන | 260 | 106 | 177 | 138 | 130 | 145 |
| උත්තේජක ලබා ගැනීම් තහවුරු වීම් | ගණන | 06 | 02 | 04 | 05 | 04 | 04 |
| විනය පරීක්ෂණ පැවැත්වීම | ගණන | 06 | 08 | 02 | 09 | 04 | 03 |
| අභියාචනා පරීක්ෂණ පැවැත්වීම | ගණන | 03 | - | 04 | 07 | 01 | 01 |
| ක්‍රීඩකයන් හා ඊට අදාළ පුද්ගලයින් දැනුවත් කිරීම | වැඩසටහන් | 46 | 28 | 35 | 48 | 45 | 18 |
| දැනුවත් වීමේ වැඩසටහන් වලට සහභාගී වූ පුද්ගලයින් | පුද්ගලයින් | 3357 | 965 | 1600 | 2316 | 2435 | 2265 |
| පර්යේෂණ Abstract වාර්තා ප්‍රකාශනය | ගණන | 00 | 01 | 00 | 02 | - | - |
| මුළු පර්යේෂණ වාර්තා ප්‍රකාශනය | ගණන | 00 | 00 | 02 | 01 | - | 05 |
| මෘදුකාංග සංවර්ධනය ( ජංගම සහ වෙබ්) | පුද්ගලයින් | 01 | 01 | 00 | 00 | - | - |
| මුළු කාර්ය මණ්ඩලය | රු.මි. | 23/27 | 22/28 | 23/29 | 19/29 | 17/29 | 18/29 |
| වැටුප් සහ වේතන | රු.මි. | 13.4 | 13.4 | 15.5 | 16.7 | 15.9 | 18.6 |
| ආදායම | රු.මි. | 0.72 | 2.93 | 1.85 | 2.32 | 5.13 | 4.92 |
| දේපළ පිරියත උපකරණ | රු.මි. | 273 | 286 | 270 | 260 | 228 | 199 |
| ජංගම වත්කම් | රු.මි. | 4.9 | 4.6 | 7.4 | 5.3 | 4.9 | 20.3 |
| ජංගම වගකීම් | රු.මි. | 8.2 | 15.3 | 16.0 | 12.63 | 5.7 | 10.7 |

# සභාපතිතුමාගේ පණිවුඩය



2024 මූල්‍ය වර්ෂය තුළ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විශිෂ්ට කාර්ය සාධනයක් පෙන්වා දී ඇති බව මා සතුටින් ප්‍රකාශ කරමි. පුරා වසර ගණනාවක් ක්‍රීඩාවේ ජීවගුණය පවත්වාගෙන යමින් පිරිසිදු ක්‍රීඩාවක් කරා ක්‍රීඩක ක්‍රීඩිකාවන් හසුරුවමින්, සාධාරණත්වයෙන් හා විනයකින් තොර වූ තරගකාරී ක්‍රීඩා ගමන්මගට බාධක එල්ල කරමින් අප ආයතනය ශ්‍රී ලාංකීය ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අනගිභවනීය කර්තව්‍යයක් ඉටු කරමින් සිටින බව අප සැම දන්නා කරුණකි.

ශ්‍රී ලංකීය නාමය ජාත්‍යයන්තර තලයට ඔසවා තැබීමෙහි ලා අන්තර්ජාතික ක්‍රීඩා තරඟ වලදී ක්‍රීඩාවේ යෙදීමට වෙර දරන ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් සුදුසුකමින් තොර නොවීම (Non-Compliance) උදෙසා අඛණ්ඩව පවත්වා ගත යුතු උත්තේජක මර්දන ප්‍රමිතීන්, අන්තර්ජාතික තත්වයන් හා නියමයන්ට අනුකූල වූ නිසි ක්‍රමවේදයන් යටතේ පවත්වාගෙන යාම සඳහා අප ආයතනය වගකීමෙන් යුතු ව ක්‍රියාත්මක වෙයි.

ක්‍රීඩාවක් තුළ ජය හෝ පරාජය ලැබුව ද ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩිකාවක සතු ආත්ම අභිමානය නොසැලී පවතින්නේ එය පිරිසිදු හා අව්‍යාජ වීම තුළය. අද වන විට ක්‍රීඩාවක ජය පරාජය තීරණය වන ප්‍රධාන සාධකය ලෙස තහනම් උත්තේජක භාවිතය හඳුනාගෙන ඇත. එය විශේෂයෙන්ම ක්‍රීඩාවේ ජීව ගුණය හා සාධාරණත්වය අභිබවා යෑමට තරම් වූ කළු පැල්ලමක් වී ඇත. කෙසෙවෙතත් ක්‍රීඩාවක ජයග්‍රහණයට නිසි මාවත විවර වන්නේ, නිරන්තර පුහුණුව, කැපවීම හා ඊටම අනන්‍ය වූ දක්ෂතා තුළ පමණක් බව අප මතකයේ තබාගත යුතුය. නූතන තාක්ෂණික දියුණුව තුළින් අත්පත් කරගත් අනිසි ඵලයක් ලෙස තහනම් උත්තේජක හැඳින්විය හැකිය.

මෙවන් පසුබිමක් තුළ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය යටතේ ක්‍රියාත්මක වන, ලොව පුරා විසිරී පවතින උත්තේජක මර්දන නියෝජ්‍යායතනවල කාර්යභාරය ඉතා වැදගත් ය. ශ්‍රී ලංකාව තුළ ද මෙම තහනම් උත්තේජක සම්බන්ධ අවදානම හිස ඔසවමින් පවතින බව පසුගිය වසර කිහිපය තුළ වූ තහනම් උත්තේජක පරීක්ෂණ දත්ත වාර්තා මඟින් සනාථ වේ.

පර්යේෂණ තුළින් ලද ප්‍රතිඵල අනුව තහනම් උත්තේජක සම්බන්ධව ලාංකිය ක්‍රීඩකයා සතු දැනුවත්භාවය ප්‍රමාණවත් නොවන බව පෙනී යාමත් සහ මේ සම්බන්ධව ලැබෙන මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් අනතුරුව පසුගිය වසර කිහිපය තුළ මෙයට අදාලව දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් අයුරින් දීප ව්‍යාප්තව සංවිධානය කරන ලදී. ඒ ඔස්සේ තහනම් උත්තේජක භාවිතයේ අනිසි ඵල විපාක, නීතිය ඉදිරියේ වරදකරුවන් බවට පත්වීම සහ ක්‍රීඩාවේ අනාගතයට සිදුවන බලපෑම් පිළිබඳ අවබෝධය ලබා දීම ආදිය සිදු වේ. මෙහි දී විශේෂාකාරයෙන් ක්‍රීඩාවන් හී නිරතවන්නන් පමණක් නොව මේ සම්බන්ධ අනෙකුත් පාර්ශවයන් සඳහා ද දැනුවත් කිරීමේ වැඩසටහන් ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

වත්මන් අභියෝගකාරී සමාජ, ආර්ථික පසුබිම තුල වුවද හුදෙක්ම ක්‍රීඩාවේ අභිවෘද්ධිය උදෙසා ක්‍රියාත්මක කරන සියලු වැඩ සටහන්, පර්යේෂණ සහ විමර්ශන කටයුතු අඛණ්ඩ ව පවත්වාගෙන යාමට සමත් වීම අප ආයතනය ලද ඉමහත් ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ය. විශේෂයෙන් පවත්නා අභියෝග මධ්‍යයේ වුව ද ක්‍රීඩාවේ අව්‍යාජ බවට හා පිරිසිදු බවට තර්ජනයක් වූ පුද්ගලයන්, නීතිය අභිමුවට රැගෙන ඒමේ කටයුතු, හිඩැස් රහිතව, සැමට පොදුවේ නීතිය ක්‍රියාත්මක කිරීමට අපට හැකි වී ඇත. ඒ අනුව තරගාවලි තුළ මෙන් ම තරගාවලියෙන් පරිබාහිරව ද තහනම් උත්තේජක සඳහා මූත්‍රා සාම්පල පරීක්ෂණ වැඩි වශයෙන් සිදු කරන ලදී. විශේෂාකාරයෙන් 2024 වර්ෂය තුළ තහනම් උත්තේජක ලබා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වැඩි ප්‍රමාණයක් හඳුනා ගෙන ඔවුන්ට එරෙහිව අදාල ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ලැබුණි. තවද ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ මෙන්ම ඉන් ඔබ්බට ගොස් පාසල් මට්ටමේ සහ අනෙකුත් ක්‍රීඩා තරග වලදී ද තහනම් උත්තේජක පරීක්ෂාව සිදුකරනු ලබයි.

එසේම මෙම වසර තුල UNESCO ආයතනයේ සහයෝගය ද ලබා ගැනීමට හැකි වූ අතර විශේෂයෙන්ම ඒ ඔස්සේ විවිධ වැඩසටහන් සංවිධානය කල අතර දීප ව්‍යාප්ත චිත්‍ර තරඟාවලියක් පාසල් මට්ටමේන් සංවිධානය කරන ලදි. එමගින් සිසු ප්‍රජාව අතර තහනම් උත්තේජක සම්බන්ධ සාක්ෂරතාව වැඩිදියුනු කිරීම ප්‍රධාන අරමුණ විය. ප්‍රජා සත්කාර වැඩසටහන් (Outreach Program) ද මැනෙවින් ක්‍රියාත්මක විය. මෙම වසරේ විශේෂ සිදුවීමක් ලෙස අප ආයතනයේ නිලධාරියෙක් අන්තර්ජාතික උත්තේජක පාලන නිලධාරියකු (Doping Controller Officer) ලෙස පැරිස් ඔලිම්පික් උලෙල නියෝජනය කිරීමේ අවස්ථාව හිමිකර ගැනීම සැලකිය හැක.
තහනම් උත්තේජක සම්බන්ධ පරීක්ෂණ තවදුරටත් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා Chaperone පුහුණු වැඩසටහන් වැඩි වශයෙන් සිදු කරනු ලබයි. තවද මෙම පුහුණු වැඩසටහන් සඳහා විශ්ව විද්‍යාලීය සිසුන් සම්බන්ධ කර ගැනීමත්, ඒ තුළින් පුහුණුව හා සුදුසුකම් වලින් සැදුම්ලත් නව නිලධාරීන්ගේ සහය ද මෙම වසර තුලදී ලබා ගැනිණ. එලෙසම පර්යේෂණ රසායනාගාරය මගින් අඛණ්ඩව පර්යේෂණ සිදු කරන අතරම පර්යේෂණ ලිපි/පත්‍රිකා (Research Articles) පිළිබඳ කටයුතු ද සිදුකෙරෙමින් පවතී. මෙමගින් අන්තර්ජාතික මට්ටමේ පර්යේෂණ සඳහා ද අවකාශය සැලසේ.
තවද ආයතනයේ අනාගත සුභසිද්ධිය තකා මූල්‍ය වගකීම් ද සාර්ථකව මෙම වසර තුළදී ද අඛණ්ඩව සිදු විය. ඒ අනුව ආයතනයේ කටයුතු සඵල කරගැනීමට, මූල්‍ය වාර්තා සකස් කරමින් ආයතනයේ මුදල් පාලන හා ගණුදෙණු කටයුතු ගිණුම් අංශය විසින් ද, පර්යේෂණ හා සොයා ගැනීම් රසායනාගාර අංශය විසින් ද, ක්‍රීඩා හා ප්‍රජා සත්කාර වැඩසටහන් අධ්‍යාපන අංශය විසින් ද, නෛතික ක්‍රියාකාරකම් හා ඊට අදාළ කටයුතු නීති අංශය විසින් ද ඒකාබද්ධ ව සිදුකරනු ලබන අතර සියලු කටයුතු නියාමනය කිරීම, මෙහෙය වීම, හා අධීක්ෂණය කිරීම ආයතනයේ ඉහල නිලධාරී මණ්ඩලය විසින් සිදුකරන ලදි.

මෙවන් විශිෂ්ට කාර්ය සාධනයක් දක්වමින් පසුගිය වසරක කාල පරිච්ඡේදය පුරාවට ආයතනයේ වැඩ කටයුතු නිසි පරිදි ඉටු කිරීමට නොපසුබට ව, කැපවීමෙන් යුතුව කටයුතු කළ සහ විවිධාකාරයෙන් සහයෝගය දැක්වූ සියලුම පාර්ශවයන්ට මාගේ කෘතඥතාවය පිරිනමමි. මේ අයුරින්ම ඉදිරි වර්ෂ තුළදී ද තවදුරටත් විධිමත් මෙන්ම අර්ථාන්විත ආකාරයට පිරිසිදු, අව්‍යාජ ක්‍රීඩාව නගා සිටුවීමේ මාර්ගය සකස් කරමින් ආයතනයේ දැක්ම සහ මෙහෙවරට ජීවයක් දීමට සියලුම දෙනාට අවැසි ශක්තිය සහ ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය අර්ජුන ද සිල්වා
සභාපති
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය



2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ගැනිමට එරෙහි සම්මුති පනත ප්‍රකාරව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතය පිහිටුවා ඇත්තේ ක්‍රීඩාවේ දී භාවිත කරන තහනම් ද්‍රව්‍ය සහ තහනම් ක්‍රමවේද මුලිනුපුටා දමා ශ්‍රී ලංකාව තුළ පිරිසිදු ක්‍රීඩා පරිසරයක් ගොඩනැංවීමේ අරමුණ පෙරදැරි කර ගනිමිනි.
එම උදාර අරමුණ අනුව යමින් පාසල් සිසුන් දැනුවත් කිරීමේ අවශ්‍යතාවය මත මේ පිළිබඳ කරුණු 6 - 11 ශ්‍රේණි දක්වා පාසල් පෙලපොතට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. එම විෂය නිර්දේශ සංශෝධන 2026 වර්ෂයේ විට පාසල් පෙලපොතට ඇතුළත් වීමට නියමිත වේ.
අප ආයතයේ ප්‍රමුඛ කර්යය වන්නේ තහනම් ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම පිණිස සිදු කරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහයවිම වේ. ඒ අනුව ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් සහ ක්‍රීඩකයන් සමඟ එක්ව කටයුතු කරන සහයක පිරිස් 2265 ක් සඳහා වැඩසටහන 18 ක් 2024 වර්ෂයේ දී පවතවන ලදී. එසේම තහනම් උත්තේජක පරීක්ෂණ වර්ෂය පුරා සිදු කළ අතර ක්‍රීඩාව තුළ දී (In competition) 79 ක් සහ ක්‍රීඩාවෙන් පිටදී පරික්ෂණ (Out competition) 66 ක් සිදු කරන ලදි.
ආයතනය පිහිටුවා වසර 11ක් ගත වී ඇතත් 2013 අංක 33 දරණ උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කර නොමැති බැවින් පිරිසිදු ක්‍රීඩා පරිසරයක් නිර්මාණය කිරීමට පැවති බාධා හඳුනා ගනිමින් ඒවා ජයග්‍රහණය කිරීමට අවශ්‍ය නෛතික සංශෝධන පනත් කෙටුම්පතට ඇතුළත් කිරීමට අවශ්‍ය මූලික වැඩකටයුතු අවසන් කිරීමට හැකිවීම අප ලද ජයග්‍රහනයකි.
එපමණක් නොව එක්සත් ජාතීන්ගේ තහනම් උත්තේජක පිළිබඳ සම්මුතිය යටතේ තහනම් උත්තේජක ක්‍රීඩාවෙන් ඉවත් කිරීම සඳහා වූ අරමුදලේ මුදල් ප්‍රධානයක් ශ්‍රී ලංකාවට ලබා ගැනීමට හැකිවීමත් ඒ තුළින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්, ඖෂධවේදීන්, සහයක පිරිස් හා පොලිස් නිලධාරීන් දැනුවත් කිරිමට සහ මේ පිළිබඳ දැනුම ශ්‍රී ලංකාව පුරා බෙදාහැරීමට අපට හැකියාව ලැබෙනි.
එබැවින් 2024 වර්ෂය දෙස ආපසු හැරී බලන විට ඇති වන්නේ හෘදයාංගම සතුටකි. අනාගතයේදීත් ශ්‍රී ලංකාවේ පිරිසිදු ක්‍රීඩා පරිසරයක් බිහි කිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතයට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරමි.

වෛද්‍ය ශිරෝමි පිලපිටිය ද අල්විස්
අධ්‍යක්ෂක ජනරාල්
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතය

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2024



මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා
සභාපති



නීතිඥ පණ්ඩුක කීර්තිණන්ද මහතා
සාමාජික



මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා
සාමාජික



මහාචාර්ය ශෙමාල් ප්‍රනාන්දු මහතා
සාමාජික



එම්.එන්.එන් සුෆ්නා මෙනවිය
සාමාජික



වෛද්‍ය ලාල් ඒකනායක මහතා
සාමාජික



සජිත් ජයලාල් මහතා
සාමාජික




එච්.එම්.එස්.ධර්මවර්ධන මහතා
සාමාජික



වෛද්‍ය අන්වර් හම්ඩාන
සාමාජික



වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන
සාමාජික



ඩබ්ලිව්.එස්.කේ. ලියනගම මහතා
සාමාජික

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

## අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

2013 අංක 33 දරන ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතයට එරෙහි සම්මුති පනතේ 15 වන වගන්තිය යටතේ නියෝජනයතනයේ පරමාර්ථ වලට සම්බන්ධ යම් කාරණයක් හෝ සියලු කාරණා පිළිබඳව අමාත්‍යවරයා විසින් යොමු කරනු ලබන යම් කාරණයක් පිළිබඳව ද අමාතවරයාට උපදෙස් දීම මණ්ඩලයේ වගකීම වේ.

තවද, පනතේ අංක 16වන වගන්තිය ප්‍රකාරව, අමාත්‍යවරයා විසින් වරින් වර ලියවිල්ලක් මගින්, කලින් කලට විශේෂ හෝ පොදු විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

## පරිපාලන භූමිකාව

2013 අංක 33 දරන ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතයට එරෙහි සම්මුති පනතට අනුව. නියෝජනයතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත

නියෝජනයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින්. මෙම පනත මගින් ගියෝජනයතනය වෙත පවරන ලද හෝ ඒ මත පනවන ලද හෝ එයට භාරදෙන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම කළ යුතුය.

## නායකත්ව භූමිකාව

එහි නායකත්ව භූමිකාව තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරි වලට, පාලනය සහ පහත සඳහන් ක්‍රියාකාරිත්වයට මග පෙන්වීම ඇතුළත් විය යුතුය.

- උත්තේජක මර්දන ක්‍රියා සැළසුම් කිරීමට, සම්බන්ධීකරණය කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීම
- උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීම් වලට එරෙහිව පියවර ගැනීම
- යම් චංචළ හෝ නිශ්චල දේපලක් (විකිණීමෙන්, ත්‍යාග මගින් හෝ අන්‍යාකාරයකින්) අත්කර ගැනීමට දැරීමට, බද්දට හෝ දීමට, උකස් කිරීමට, ඔඩපනය කිරීමට සහ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට
- කිසියම් බැංකුවක ජංගම සහ ඉතිරි කිරීමේ ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යෑම
- ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩල වලින් හෝ පරිත්‍යාග භාර ගැනීම
- නියෝජනයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි කර්තවයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු ගිවිසුම් වලට ඇතුල් වීම හෝ ඉටු කිරීම
- නියෝජනයතනයට අයිති මුදල් කිසිවතත් ආයෝජනය කිරීම
- එහි කර්තව්‍යය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයක් ණයට ගැනීම
- මෙම පනත යටතේ නියෝජ්‍යායතනයේ කර්ත්‍යවයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, පරිශ්‍රමික දීම සහ ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඒ සේවකයන් පහ කිරීම
- නියෝජ්‍යායතනය විසින් සපයන ලද සේවා සහ සහාය වෙනුවෙන් ගාස්තු අය කිරීම
- එහි කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය යැයි නියෝජනයන අදහස් කරන වෙනත් යම් සියලු දේ සිදු කිරීම.

## සංයුතිය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ඇතුලුව සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත වේ.


- මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා - සභාපති
- නීතිඥ පණ්ඩුක කීර්තිරත්න මහතා - සාමාජික
- මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා - සාමාජික
- මහාචාර්ය ෂෙමාල් ප්‍රනාන්දු මහතා - සාමාජික
- එම්.එන්.එන්. සුජ්නා මෙනවිය - සාමාජික
- වෛද්‍ය ලාල් ඒකනායක මහතා - සාමාජික
- සජිත් ජයලාල් මහතා - සාමාජික
- එච්.එම්.එස්. ධර්මවර්ධන මහතා - සාමාජික
- වෛද්‍ය අන්වර් හම්දාන් මහතා - සාමාජික
- වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා - සාමාජික
- ඩබ්ලිව්.එස්.කේ. ලියනගම මහතා - සාමාජික

# රැස්වීම් සහ පැමිණීම

අධ්‍යක්ෂ මණ්ඩලය 2024 වසර සඳහා අවස්ථා 09ක දී රැස් වූ අතර අධ්‍යශේෂ මණ්ඩලයේ පැමිණීම පහත සඳහන් පරිදි වේ.

| නම | ජනවාරි 18 | පෙබරවාරි 02 | මාර්තු 21 | අප්‍රේල් 25 | මැයි 28 | ජූනි 27 | ජූලි 25 | අගෝස්තු 22 | සැප්තැම්බර් 19 |
|---|---|---|---|---|---|---|---|---|---|
| මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| සජිත් ජයලාල් මහතා | ✓ | ✓ | ✓ | - | - | ✓ | ✓ | ✓ | ✓ |
| වෛද්‍ය ලාල් ඒකනායක මහතා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| වෛද්‍ය අන්වර් හම්දාන් මහතා | ✓ | ✓ | ✓ | - | - | - | - | - | - |
| මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | - | ✓ |
| එච්.එම්.එස්. ධර්මවර්ධන මහතා | ✓ | | | | | | | | |
| වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා | ✓ | - | ✓ | - | ✓ | - | ✓ | - | - |
| මහාචාර්ය ෂෙමාල් ප්‍රනාන්දු මහතා | - | - | - | ✓ | ✓ | - | - | - | ✓ |
| පණ්ඩුක කීර්තිරත්න මහතා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| එම්.එන්.එන්. සුෆ්නා මෙනවිය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | - |
| ඩබ්ලිව්.එස්.කේ. ලියනගම මහතා (මුදල් අමාත්‍යාංශයේ නියෝජනය ලෙස එච්.එම්.එස්. ධර්මවර්ධන මහතා වෙනුවට ඩබ්ලිව්.එස්.කේ. ලියනගමගේ මහතා පෙබරවාරි මස සිට සහභාගීවීම) | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |

# සංවිධාන ව්‍යුහය



සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)
සහකාර අධ්‍යක්ෂ
කළමනාකරණ සහකාර
පර්යේෂණ නිලධාරි(03)
තාක්ෂණ සහකාර (01) (පර්යේෂණාගාර)
ගණකාධිකාරි
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සහකාර
තොරතුරු තාක්ෂණ නිලධාරි
සංවර්ධන නිලධාරි
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
සංවර්ධන නිලධාරි (01)
තාක්ෂණ සහකාර (01)
කළමනාකරණ සහකාර
රියදුරු (04)
කාර්යාල සහායක (03)
නීති නිලධාරි/ මණ්ඩලීය ලේකම්
සහකාර අධ්‍යක්ෂ
කළමනාකරණ සහකාර
HM
MM 1.1
AR-1
JM
MA-4
MA-3
MA1-1
MA 2-1
PL-3
PL-1

# කාර්ය මණ්ඩල තොරතුරු

කළමනාකරණ සේවා දෙපර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත 29 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත.

| | තනතුරු නාමය | වැටුප තලය | තනතුරු සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | HM 2 - 1 | 1 | 1 | - |
| 2. | අධ්‍යක්ෂ | HM 1-1 | 2 | 1 (තාවකාලික) | 1 |
| 3. | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ | MM 1-1 | 2 | 2 | - |
| 4. | ගණකාධිකාරී | MM 1-1 | 1 | 1 | - |
| 5. | නීති නිලධාරී / අධ්‍යක්ෂ මණ්ඩලීය ලේකම් | MM 1-1 | 1 | 1 | - |
| 6. | පර්යේෂණ නිලධාරී | AR 1 | 3 | 2 | 1 |
| 7. | පරිපාලන නිලධාරී | JM 1-1 | 1 | - | 1 |
| 8. | තොරතුරු තාක්ෂණ නිලධාරී | JM 1-1 | 1 | - | 1 |
| 9. | භාෂා පරිවර්තක | MA - 4 | 1 | 1 | - |
| 10. | සංවර්ධන නිලධාරී | MA - 3 | 3 | - | 3 |
| 11. | කළමනාකරණ සහකාර | MA 1-1 | 4 | 2 | 2 |
| 12. | තාක්ෂණ සහකාර | MA 2-1 | 2 | 2 | - |
| 13. | රියදුරු<br>*රියදුරු පුරප්පාඩු හේතුවෙන් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය මගින් තාවකාලිකව එක් රියදුරෙකු අනුයුක්ත කර ඇත | PL 3 | 4 | 2 | 2 |
| 14. | කාර්යාල කාර්ය සහයක | PL 1 | 3 | 3 | - |
| එකතුව | | | 29 | 18 | 11 |

# මෙහෙයුම් ප්‍රගතිය

## අධ්‍යාපන අංශය හා පරීක්ෂණ

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන අධ්‍යාපන වැඩසටහන් 2024**

2024 වර්ෂයේදී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති 3 ක් ආරම්භ කෙරේ.




- ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, ජාතික අධ්‍යාපන ආයතනයේ (NIE) සහයෝගයෙන් 2024 වර්ෂයේ සිටියේ 6 - 11 ශ්‍රේණි දක්වා නව සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපන විෂය මාලාවක් හඳුන්වා දී ඇත. පිරිසිදු ක්‍රීඩාව පිළිබඳ වාර්ෂිකව පැය 3 ක ඉගෙනීමක් සහිත " ක්‍රීඩාවේ නීති සහ ආචාර ධර්ම" පිළිබඳ මොඩියුලයක් එයට ඇතුළත් වේ.
- ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ජාතික අධ්‍යාපන ආයතනය සමඟ හවුල්කාරීත්වයෙන්, නව තහනම් උත්තේජක මර්දනය පිළිබඳව මොඩියුලයන් ඉගැන්වීම සඳහා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන්ට දැනුම ලබාදීම සඳහා රට පුරා පුහුණු වැඩසටහනක් දියත් කරයි. ශ්‍රී ලංකාව තුළින් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ 10 ක පැය 30 ක වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ.
- රජයේ විශ්ව විද්‍යාල ක්‍රීඩා විද්‍යා උපාධි වැඩසටහන් තුළ ක්‍රීඩා නීති මොඩියුලේට තහනම් උත්තේජක මර්දනය පිළිබඳ අධ්‍යාපනය ඒකාබද්ධ කිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් විසින් කටයුතු කෙරේ.

## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පිරිසිදු ක්‍රීඩාව පිළිබඳ අධ්‍යාපනඥයින්













2024 වර්ෂයේ දී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අර්ධකාලීන පිරිසුදු ක්‍රීඩා අධ්‍යාපනඥයින් 40 දෙනෙකු හෝ පුහුණු කිරීම සඳහා පිරිසිදු ක්‍රීඩා අධ්‍යාපනය පිළිබඳ මාස 3 ක සහතික පත්‍ර පාඨමාලාවක් ආරම්භ කරන ලදී. මෙම මුල පිරීමමගින් සෑම දිස්ත්‍රික්කයකම අවම වශයෙන් එක් අධ්‍යාපනඥයෙකු හෝ සිටින බව සහතික කෙරෙන අතර, එමගින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයටඅඩු වියදම් සහිතව දිවයින පුරා පිරිසුදු ක්‍රීඩා අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීමට හැකි වේ.

**පිරිසිදු ක්‍රීඩා අධ්‍යාපන වැඩසටහන්**

2024 වර්ෂයේ දි ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් දිවයින පුරා පිරිසිදු ක්‍රීඩා අධ්‍යාපන වැඩසටහන් 70 ක් පැවැත්වීය. මෙම වැඩසටහන් වල සරාංශය පහත පරිදි වේ.




## උත්තේජක පාලන පරීක්ෂණ 2024




| වැඩි වශයෙන් සිදු කළ පරීක්ෂණ සංඛ්‍යාව | |
|---|---|
| මලල ක්‍රීඩා | 20% |
| ක්‍රිකට් | 19% |
| පැරා - මලල ක්‍රීඩා | 9% |
| බර ඉසිලීම | 8% |

# නීති අංශය

2024 වර්ෂය තුළ නීති අංශයේ කාර්යභාරය පහත පරිදි වේ.

- ✓ 2023 අගභාගයේ හා 2024 වර්ෂය තුළ උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීම සම්බන්ධයෙන් වාර්තා වූ ක්‍රිඩකයන්ට එරෙහිව විනය පරීක්ෂණ පැවැත්වීම සහ ඒවායේ අවසන් තීරණ ප්‍රකාශයට පත් කිරීම.
- ✓ අභියාචනා පරීක්ෂණයෙන්හි පැහැදිලි අවසන් තීන්දු ලබාදීම සඳහා අභියාචනා පරීක්ෂණ පැවැත්වීම. එකී සෑම අවස්ථාවක දී ම වාචික හා ලිඛිත දේශන සිදු කිරීම හා අවශ්‍ය නීතිඥ සහයෝගය ලබා ගැනීම සඳහා කටයුතු සංවිධානය කර දීම.
- ✓ අභියාචනා පරීක්ෂණ සහ විනය පරීක්ෂණ තුළින් ලබා දුන් තීන්දු නිසි පරිදි අදාළ පාර්ශව වෙත සන්නිවේදනය කිරීම.
- ✓ අභියාචනා පරීක්ෂණ සහ විනය පරීක්ෂණ අවශ්‍යතාවය පරිදි මාර්ගගත තාක්ෂණය මගින් නිසි පරිදි පැවැත්වීම.
- ✓ 2025 - තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව පාර්ලිමේන්තු අනුමැතිය සඳහා යොමු කිරීමට අවශ්‍ය මූලික පියවර ගැනීම.
- ✓ අශ්ව ක්‍රීඩා සහ තුරග තරඟ සඳහා තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව පාර්ලිමේන්තු අනුමැතිය සඳහා යොමු කිරීමට අවශ්‍ය මූලික පියවර ගැනීම.
- ✓ දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී තහනම් උත්තේජක භාවිතය සම්බන්දයෙන් වන නෛතික රාමුව පිලිබඳ ක්‍රිඩකයින් දැනුවත් කිරීම.
- ✓ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, මාර්ගගත තාක්ෂණය යොදා ගෙන සාම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැර ව නව මුහුණුවරකින් පැවැත්වීම.
- ✓ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නියමයන්ට අනුව සහ නියෝජ්‍යායතනයේ පවත්නා අවශ්‍යතා අනුව 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත පනත සංශෝධනයට අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම.

# බලාත්මක කිරීම් හා ක්‍රියාත්මක කිරීම් අංශය

## 2024 වර්ෂයේ ප්‍රගතිය

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| පුහුණු වැඩසටහන් | 9 | 957 |
| එළිමහන් දැනුවත් කිරීමේ කුටි | 9 | 1308 |

| පැමිණිලි සහ විමර්ශන වාර්තා | ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| ලද පැමිණිලි | 6 | 6 |
| අභ්‍යාන්තර මූලික විමර්ශන වාර්තා | 3 | 3 |



දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේ දී පවත්වන 2024.07.15 සහ 16 වන දිනයන් හී දී පවත්වන ලද බාහිර දැනුවත් කිරීමේ වැඩසටහන

2024 .08.01 දින පහළාම පොලිස් අභ්‍යාස විද්‍යාලයේ දී පවත්වන ලද පොලිස් නිලධාරි දැනුවත් කිරීමේ වැඩසටන



# පර්යේෂණ අංශය

01. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා අංශය සමඟ එකතුව ආරම්භ කරන ලද පර්යේෂණ 5 සාර්ථකව අවසන් කර එම පර්යේෂණ වල Abstract ප්‍රකාශය විද්‍යාත්මක සම්මේලන වලට ඉදිරිපත් කර ප්‍රකාශයට පත් කරන ලදී.

02. SLADA පර්යේෂණ අංශයේ පර්යේක්ෂණ කටයුතු පුළුල් කිරීම උදෙසා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා අංශය සමඟ සහයෝගීව පර්යේක්ෂණ කටයුතු සිදු කිරීම අරමුණු කරගෙන අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

03. කැළණිය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා අංශය සමඟ සහයෝගීතාවයෙන් විද්‍යාගාර පර්යේෂණයක් ආරම්භ කර සාර්ථකව අවසන් කරන ලදී.

04. වයඹ විශ්ව විද්‍යාලයේ ආහාර හා පෝෂණ අංශය සමඟ සාකච්ඡා කර නව සමාජ විද්‍යා පර්යේෂණයක් ආරම්භ කරන ලදී. එහි දත්ත එකතුකිරීම අවසන් කර දත්ත විශ්ලේෂණ අවධියේ පවති.

05. කැළණිය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා අංශය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට මූලික සාක්ච්ඡා පවත්වන ලදී.

06. SLADA විද්‍යාගාරය භාවිතා කර ආදායම් ඉපයීම සඳහා LC-MS/MS උපකරණය යොදා ගෙන සිදු කළ හැකි workshop නිර්මාණය කර විශ්ව විද්‍යාල සිසුන්, ආචාර්යවරු සහ පර්යේෂකයින් සඳහා එම workshop මුදල් අය කර පවත්වන ලදී.

07. තවද LC-MS/MS උපකරණය සහ SLADA විද්‍යාගාරය භාවිතා කර ආදායම් ඉපයීම සඳහා SLADA විද්‍යාගාරය මගින් සැපයිය හැකි පරීක්ෂණ සේවා සහ පර්යේක්ෂණ පහසුකම් පිළිබඳ බාහිර පාර්ශවයන් දැනුවත් කිරීමට ප්‍රචාරණ දැන්වීම් නිර්මාණය කර විද්‍යුත් සහ සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය කරන ලදී. මීට අමතරව ලිපි මගින් ද විශ්ව විද්‍යාල සහ ආයතන දැනුවත් කරන ලදී.

08. LC-MS/MS උපකරණ භාවිතා කර බාහිර පාර්ශවයන්ගේ සාම්පල පරීක්ෂා කර දී ආදායම් උපයන ලදී.

09. LC-MS/MS උපකරණය සහ SLADA පර්යේෂණාගාරය භාවිතා කර සිසුන්ගේ පර්යේෂණ කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබා දිය හැකි ආකාර පිළිබඳ පෞද්ගලික විශ්ව විද්‍යාල ආචාර්යවරු සමඟ සාකච්ඡා පවත්වන ලදී. එහිදී එකඟ වූ පරිදි ICHEM පෞද්ගලික විශ්ව විද්‍යාලයේ පර්යේක්ෂණ කණ්ඩායමකට ඔවුන්ගේ පර්යේක්ෂණයක කොටසක් SLADA විද්‍යාගාරය භාවිතා කර සිදු කිරීමට අවස්ථාව ලබා දුන් අතර මේ සඳහා පිරිවැය ගණනයක් සිදු කර මුදල් ලබාගන්නා ලදී.

10. SLADA විද්‍යාගාර පර්යේෂණ සඳහා වැයවන පිරිවැය අවම කර ගැනීමට බාහිර ආයතන සමග සාකච්ඡා කර Collaborative Research ආරම්භ කරන ලද අතර මෙහිදී පර්යේෂණය සිදු කිරීමට අවශ්‍ය ඇතැම් මිල අධික රසයන ද්‍රව්‍ය ඔවුන් විසින් ලබා දීමට එකඟ විය.

11. LC-MS/MS උපකරණය භාවිතා කර, සිදු කරගත හැකි විශ්ලේෂණ ක්‍රම සහ එහි උසස් ගනයේ භාවිතයන් පිළිබඳ තවදුරටත් Local Agent මගින් වැඩිදුර පුහුණුව ලබා ගන්න ලදී.




**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා අංශය සමඟ එකතුව අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.**





**විශ්ව විද්‍යාල සිසුන් LC-MS/MS උපකරණය යොදා ගෙන පර්යේෂණ සිදු කර ගන්නා ලදී.**









**LC-MS/MS උපකරණය යොදා ගෙන සිදු කළ හැකි workshop සිදු කිරීම.**





කැළණිය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා අංශය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට මූලික සාකච්ඡා පවත්වන ලදී.




**LC-MS/MS** උපකරණය සහ **SLADA** විද්‍යාගාර භාවිතා කර බාහිර පාර්ශවයන් දැනුවත් කිරීමට ප්‍රචාරක දැන්වීම් නිර්මාණය කර විද්‍යුත් සහ සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය කිරීම.





**ICHEM** පෞද්ගලික විශ්ව විද්‍යාලයේ පර්යේක්ෂණ කණ්ඩායමක් ඔවුන්ගේ පර්යේක්ෂණයක කොටසක් **SLADA** විද්‍යාගාරය භාවිතා කර සිදු කිරීමට සාකච්ඡා කිරීම.



**සමාජ විද්‍යා පර්යේක්ෂණ සඳහා දත්ත එකතු කිරීම.**





**SLADA විද්‍යාගාරය භාවිතා කර සිදු කර ඇති පර්යේක්ෂණ සහ SLADA පර්යේක්ෂණ අංශය මගින් ලබා ගත ඇති සේවා පිළිබඳ විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීම.**



**LC/MS /MS උපකරණය භාවිතය සඳහා වැඩි දුර පුහුණුව ලබා ගැනීමට Shimadzu ආයතන සහ Hayleys ආයතන ප්‍රධානීන් සමග සාකච්චා කිරීම.**

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

"ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැප වී සිටින අතර, එය ස්වකීය ආයතනික අරමුණු හරහා ශ්‍රී ලාංකීය ක්‍රීඩකයින්ට ක්‍රමයෙන් නියත හා තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි."



ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මූලික වශයෙන් ම තිරසාරභාවය පවත්වාගත් ආයතනයකි. ආරම්භයේ සිට ම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හුදෙක් එහි ආසන්නතම පාර්ශවකරුවන්ගේ සුබසිද්ධියට වඩා වැඩි යමක් සැළකිල්ලට ගනිමින් ක්‍රීඩකයින්ගේ සමස්ත දිගු කාලීන අවශ්‍යතා හා සාරධර්ම සමඟ නොගැටෙන බව සහතික ලෙස විශ්වාස කරයි. මණ්ඩලයේ තිරසාරභාවය පිළිබඳ වාර්තාව එහි පැතිකඩ, තිරසාරභාවය සඳහා වන උපායමාර්ග, ආර්ථික වගකීම, සමාජ වගකීම සහ පාරිසරික වගකීම යන ඒවායින් සමන්විත වේ.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැප වී සිටින අතර එය ස්වකීය අරමුණ ළඟා කර ගැනීම හරහා ක්‍රීඩකයින්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි. මෙම වාර්තාව මගින් සමාජ, පාරිසරික හා ආර්ථික වගවීම පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගෙන ඇති ක්‍රියාමර්ග අවධාරණය කර ඇත. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි සමාජ වගකීමට නියෝජ්‍යායතනයේ, ක්‍රීඩකයන්ගේ සහ ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති වගකීම් සහගත ක්‍රියාමාර්ග ඇතුළත් වේ. පාරිසරික වගකීම සාක්ෂාත් කර ගැනීම පිණිස අපගේ නියෝජ්‍යායතනය ස්වකීය ආයතනික ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම අධීක්ෂණය කරමින් පරිසර හිතකාමී ආයෝජන සිදු කරයි. ආර්ථික වගකීම, විනිවිදභාවයෙන් යුතු සහ සමබර වන පාලන ආකෘතියක් බවට පරිවර්තනය වෙයි.

## අපගේ මූලික සාරධර්ම

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය කැපවීමෙන් යුතු සහ දැඩි ලෙස උද්යෝගීමත් සේවකයින් සම්බන්ධයෙන් සඳහන් කිරීමේ දී, ඔවුන් අපට අති මහත් සහයෝගයක් ලබා දී ඇත. තමන් ද එහි කොටසක් වීම ගැන ඔවුන්ට ආඩම්බර විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමට අප මහත් සේ වෙහෙසෙන්නේ එබැවිනි. අපගේ ශ්‍රම බලකායෙහි විශිෂ්ටත්වය සහ සාර්තකත්වය දිරිගැන්වීම පිණිස පුහුණුව සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා දීම මගින් අප අපගේ සේවක පිරිස සඳහා ආයෝජනය කරනුයේ අපගේ ආයතනයේ සාර්ථකත්වය රඳා පවතින්නේ තම රැකියාව පිළිබඳ ව ඔවුන්ගේ ඇති තෘප්තිමත්භාවය මත වන බව අපි අවබෝධ කර ගෙන සිටින බැවිනි.

## පාරිසරික වගකීම

පරිසරයට වන බලපෑම අවම කිරීම සඳහා අප විසින් දරන ලද ප්‍රයත්නයන් සාර්ථක වී ඇත. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සේවකයන් සඳහා පරිපූර්ණ පුහුණුව, නව්‍ය තාක්ෂණය සහ පාර්ශවකරුවන් සමඟ සහයෝගීතාවය හරහා ඵලදායී සහය සේවාවන් සපයා දීමට දොරටුවක් විවර කර දෙයි. අප විසින් ඇන්ඩ්‍රොයිඩ් App යෙදවුම හඳුන්වා දීම මෙම අරමුණුවලට සාක්ෂි වේ. ඩිජිටල්කරණය හරහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්වකීය ක්‍රීඩකයින්ගේ පහසුව උදෙසා වැඩි වැඩියෙන් යෙදවුම් සහ ඊ-සේවා හඳුන්වා දෙමින් පෘථිවිය මත කාබන් පියසටහන අවම කිරීමට ඉලක්ක කරයි. අපි පාරිසරික බලපෑම පිළිබඳ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මෙහෙයුම් වැඩිදියුණු කිරීමට සහ සේවකයින් අතර හරිත දැනුවත්භාවයක් වැඩි කිරීමට ද අදහස් කරන්නෙමු. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය තිරසාර වටිනාකමක් නිර්මාණය කරමින් කැප වූ සංවර්ධනයක් කෙරෙහි අවධානය යොමු කරයි. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්වකීය ආයතනික ව්‍යායාමයන්හි පාරිසරික බලපෑම් අධීක්ෂණය කරන අතර පාරිසරික වගකීම ඉටුකිරීම පිණිස බලශක්තිය ඉතිරි කිරීමේ ආයෝජනය ද සිදු කරයි.

## අපගේ සමාජ වගකීම

අපගේ ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්ති පදනම් කරගෙන අපව වටිනා ප්‍රජා සාමාජිකයෙකු ලෙස පිළිගනු ලැබීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අපට අවශ්‍ය ය. එම නිසා අර්ථාන්විත, දිගුකාලීන හවුල්කාරීත්වයන් තුළින් ක්‍රීඩකයන්ට සහ ප්‍රජාවට දායකත්වය සපයා දීමට සහ පාරිසරික වශයෙන් තිරසාර ආකාරයකින් ආයතනික කටයුතු කරගෙන යාමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අවධානය යොමු කරයි.

## මානව සම්පත්

යහපත් ව්‍යාපාරික පිළිවෙත් සංවර්ධනය කිරීමේ දී සහ කල් පවත්නා පාරිභෝගික සම්බන්ධතා ගොඩනැගීමේ දී අපගේ සේවකයිනගේ වැදගත් කාර්යභාර්ය අපි පිළිගැනීමට ලක් කරන්නෙමු. අපි අපගේ සේවකයින්ව ඉතා දැඩි ලෙස අගය කරන අතර, ඔවුන් ලබා දෙන ඉතා වටිනා දායකත්වයන් පිළිබඳ අපගේ ඇගයීම පෙන්නුම් කිරීම සඳහා නව්‍ය, සහයෝගී සහ ආකර්ෂණීය සේවා ස්ථානයක් නිර්මාණය කර ලබා දුන්නෙමු.

## කාර්ය මණ්ඩල සංවර්ධනයෙහි අරමුණු

- රැකියා සහ වෘත්තීය අවස්ථා නිර්මාණය කිරීම හා දිරිමත් කිරීම.
- ශ්‍රම බලකාය සැලසුම් කිරීම සහ නිපුණතා කළමනාකරණ වැඩසටහන්, ගුණාත්මක බඳවා ගැනීම් සහ රඳවා ගැනීමේ ක්‍රියාමාර්ග, නායකත්ව සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය සංවර්ධනය කිරීම සහ අඛණ්ඩ අධ්‍යාපනික දැනුම ලබා දීම අඛණ්ඩව වැඩිදියුණු කිරීම.
- අපගේ සේවකයින්ව සවිබල ගන්වනු ලබන බව සහ ඔවුන්ගේ ජයග්‍රහණ සඳහා ඔවුන්ට දිරිගැන්වීම් ලබා දෙනු ලබන බව සහතික කිරීම.
- ආයතනික ක්‍රමෝපායික දිශාව පිළිබඳ ව අපගේ කාර්ය මණ්ඩලය හොඳින් දැනුවත් කර සහ දැන සිටි බව සහතික කිරීම.

# ආයතනික පාලනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන පාලන පද්ධතියෙහි තීරණ ගැනීම සඳහා වන පරිවයන් මත මගපෙන්වීමේ ප්‍රතිපත්ති නිර්වචනය කර දෙන අතර ම, නියෝජ්‍යායතනයේ දිගු කාලීන අරමුණු සහ උපාය මාර්ගික සැලසුම්වලට මග පෙන්වයි. ආයතනික පාලන ආකෘතිය මගින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි විවිධ මට්ටම් අතර, විශේෂයෙන් ම පාලනයෙහි මට්ටම් අතර, එනම් අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක කළමනාකරණ මට්ටම් අතර බලතල සහ වගකීම බෙදී යන ආකාරය සංක්ෂිප්ත ව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික ප්‍රතිපත්ති ස්ථාපනය කරන අතර, අප ආයතනයේ මනා ක්‍රියාකාරීත්වය සඳහා වගකිව යුතු පුද්ගලයින් වන ප්‍රධාන විධායක නිලධාරී සහ විධායක නිලධාරීන්ට ක්‍රමෝපායික මග පෙන්වීමක් සපයා දෙයි.

අප ආයතනය 2013 අංක 13 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත මගින් පාලනය වේ. එම පනතෙහි 14(i) වගන්තිය මගින් මණ්ඩලයේ ව්‍යුහය පහත සඳහන් පරිදි දක්වා ඇත.

(අ) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයින්:

i. ක්‍රීඩා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයාගේ නිලයට වඩා අඩු නොවන ධූරයක් දරන නිලධරිවරයා;
ii. ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ-ජනරාල්වරයා;
iii. ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;
iv. ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා;

(ආ) අමාත්‍යවරයා විසින් පත්කරන ලද නීතිය, ක්‍රීඩා වෛද්‍ය සහ ක්‍රීඩා විද්‍යාව යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයට පත් වූ (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා පත් කළ යුතු අතර, මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා ද එම සභාපතිවරයා මණ්ඩලයේ කටයුතු පරිපාලන හා කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ය.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාර්ය

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල ව අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජ්‍යායතනයේ කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ය. සියලු ව්‍යවස්ථාපිත හා කළමනාකරණ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වන අතර ම, සම්පත් ආරක්ෂා කිරීම, ප්‍රමාණවත් පරිදි ගිණුම් පවත්වා ගැනීම සහ නිවැරදි වාර්තා සම්පාදනය කිරීම සහතික කරමින් මෙය ඉටු කරගත යුතු ය. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් දෑ සහතික කළ යුතු ය:

- සංවිධානයේ උපයමාර්ගික අරමුණු ක්‍රියාත්මක ව පවතින බව සහතික කිරීම
- උපයමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය ලබා දීම
- ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහ අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක ව වන බවට සහතික කිරීම
- ආයතන කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම
- නිතිපතා වන පදනමකින් අවශ්‍ය කරනු ලබන මූල්‍ය අංග සහ අනාවරණයන් පිළිබඳ ව ප්‍රමාණවත් ලෙස වාර්තා කිරීම
- සම්පත් හා වත්කම් වගකීමෙන් යුතු ව භාවිතා කිරීම
- විගණන කමිටුව සහ අනෙකුත් කමිටු පත් කිරීම; සහ චර්යාධර්ම හා ආචාරධර්ම පද්ධතියක් සහ ආයතනික පාලන උපාය මාර්ගයක් හඳුන්වා දීම
- අදාළ අණ පනත්, මාර්ගෝපදේශ සහ චක්‍රලේක ආදිය ප්‍රකාර ව ඔවුන්ගේ සියලු ක්‍රියාමාර්ග සඳහා වගකිව යුතු වීම
- අවම වශයෙන් වාර්ෂිකව හෝ ප්‍රධාන විධායක සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය පිළිබඳ ඇගයීමක් කිරීම

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

නියෝජ්‍යායතනයේ මෙහෙයුම් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ප්‍රතිඵල අයවැය සහ අදාළ ප්‍රමිතීන්ට අනුකූල ව දැඩි ලෙස හා නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සවිස්තරාත්මක ව අවශ්‍ය කරන අනෙකුත් කාරණා සමඟ සම්මත න්‍යාය පත්‍රයක් අනුගමනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස් වන අතර අවශ්‍ය ඕනෑ ම අවස්ථාවක විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට කටයුතු කරයි.

## නියෝජ්‍යායතනයේ පිහිටුවා ඇති කමිටු

1.චිකිත්සකමය භාවිත මුක්තිය පිළිබඳ කමිටුව (T.U.E.)
2.විනය මූල මණ්ඩලය
3.අභියාචනා මූල මණ්ඩලය
4.විගණන සහ කළමනාකරණ කමිටුව
5.ප්‍රසම්පාදන කමිටුව

## කළමනාකාරීත්වය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ දෛනික මෙහෙයුම් කටයුතු ප්‍රධාන විධායක නිලධාරීගේ හා ඉහළ කළමනාකාරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරණ කණ්ඩායම් වෙත පවරා තිබේ. අවදානම් සහ අවස්ථාවන් හඳුනා ගනු ලබන බව සහ නියමිත වේලාවලට අවශ්‍ය පියවර ගනු ලබන බවත්, ඉලක්ක සපුරා ගැනීම සඳහා අයවැය සකස් කරනු ලබන බවත් එම කණ්ඩායම් විසින් සහතික කරනු ලබයි.

# අවදානම් කළමනාකරණ වාර්තාව

ඵලදායී අවදානම් කළමනාකරණය ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතන ක්‍රියාවලියේ ප්‍රධාන සාධයකයකි. අපගේ ව්‍යාාපරයෙහි අවදානම් හා ප්‍රතිඵල අතර උචිත සමතුලිතතාවයක් ඇති කර ගැනීමට සහ පාලිත පරිසරයක් තුළ අපගේ වර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට උපකාරී වන අවදානම් කළමනාකරණ හැකියාවන් අඛණ්ඩ ව වැඩි දියුණු කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු. අවදානම් කළමනාකරණය ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනහි මෙහෙයුම් ව්‍යුහයේ ප්‍රධානතම අංගයක් වේ. මුහුණ දීමට සූදානම් ව සිටින අවදානම් මට්ටම ඇතුළත අවදානම් නිරාවරණය වීම් කළමනාකරණය කිරීම මගින් ඉපැයීම්වල සහ ප්‍රාග්ධනයෙහි අහිතකර විචලනයන් සීමා කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු.

අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම සඳහා වගකීම් සහතික ප්‍රවේශයක් කළමනාකරණ පද්ධතියට ඇතුළත් වේ. අවදානම් දැනුවත් කිරීමේ චර්යාවන්ට සහාය දෙන ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ එමගින් අවදානම් මත පදනම් ව තීරණ ගැනීමට අනුබලය දීම අපගේ ප්‍රධාන අවධානය වී තිබේ. ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා අපි අපගේ අවදානම් උපායමාර්ග තවදුරටත් වැඩිදියුණු කරන්නෙමු.

ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අවදානම් කළමනාකරණ උපායමාර්ග විශේෂිත පාර්ශවකරුවන්, කළමනාකරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා ප්‍රතිපෝෂණ ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වේ. ආයතනයේ ව්‍යාපාර, මෙහෙයුම්, පද්ධති සහ සේවාවන් සඳහා දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීමේ උපායමාර්ගික කේන්ද්‍රයක් ලෙස එයට හිමි වන තත්ත්වයෙන් එය සුවිශේෂී වේ. මෙය පහත සඳහන් දැ හරහා ව්‍යාපාර අවදානම්වලට ආමන්ත්‍රණය කිරීම සඳහා උපායමාර්ගිත සහ ව්‍යාපාරික සැලසුම්කරණයට, ව්‍යාපෘති කළමනාකරණයට සහ ව්‍යාපාර ක්‍රියාවලි මට්ටම්වලට ස්ථාවර ප්‍රවේශයක් සපයා දෙයි:

- ව්‍යාපාර කාර්යයන් සහ ඒකක පුරා ඇති අවදානම් පිළිබඳ පොදු අවබෝධයක් ලබා දීම.
- වැඩිදියුණු වූ ප්‍රමුඛතා නියම කරගැනීම සහ තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස කළමනාකරණයට අඛණ්ඩ අවදානම් තක්සේරුවක් සපයා දීම.
- සේවක දැනුවත්භාවය සහ කළමනාකරණ වගකීම් වැඩි කිරීම ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පහත සඳහන් කර ඇති පරිදි විශේෂිත අවදානම් සමූහයකට යටත් වේ.

**මූල්‍ය අවදානම**

අකාර්යක්ෂම මුදල් ප්‍රවාහ කළමනාකරණය හා මූල්‍ය තොරතුරු සම්බන්ධ අවදානම් මගින් ආයතනවල ඵලදායිතාවයට හානි ගෙන දිය හැකි ය. ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ආයතනය පුරා පිරිවැය පාලන උපාය මාර්ග සම්බන්ධීකරණය කිරීම වැනි මූල්‍ය අවදානම් කළමනාකරණ පිළිවෙත් භාවිතා කරයි.

**මෙහෙයුම් අවදානම**

පද්ධති ඇනහිටීම්, පුද්ගලයින් අතින් සිදුවිය හැකි දෝෂ, සාපරාධී ක්‍රියාකාරකම් හෝ අභ්‍යන්තර පද්ධතිමය බිඳවැටීම් හේතුවෙන් සිදුවිය හැකි පාඩු මෙහෙයුම් අවදානම්වලට අයත් වේ. එවැනි තත්ත්වයන් මගින් පාරිභෝගික විශ්වාසයට හා ආයතනික ප්‍රතිරූපයට හානි සිදු විය හැකිය. මෙහෙයුම් අවදානම අවම කිරීම පිණිස ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නිරතුරුව ම අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කරයි. ආයතනික අවදානම මගින් ඇති වන තර්ජනය අවම කිරීම සඳහා ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි කළමනාකාරීත්වය විසින් මෙහෙයුම් ඒකක සහ ව්‍යාපාර ක්‍රියාවලි පිළිබඳ නිරන්තර අවදානම් තක්සේරු කිරීම් සිදු කරනු ලබයි.

**නීති අවදානම**

ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට එරෙහිව ගනු ලැබිය හැකි අනාගතම නීතිමය ක්‍රියාමාර්ග වලින් ආරක්ෂා වීමට අපොහොසත් වීම නීතිමය හානි සිදුවීමේ අවදානම වැඩි කරයි. ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිළිගත් නීති වෘත්තිකයන් උපදෙස් ලබා ගෙන එවැනි ක්‍රියාමාර්ග අවම කිරීම සඳහා සුදුසු පියවර ගෙන තිබේ.

**තොරතුරු තාක්ෂණ අවදානම**

තොරුතුරු තාක්ෂණ පද්ධතිය මගින් ලබා ගන්නා නිශ්චිත හා කාලෝචිත තොරුතුරු ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනහි මෙහෙයුම් ක්‍රියාවලියේ මූලික ම අංගයක් වේ. ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්වකීය තොරුතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් දියත් කර ඇත.

# විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

විගණන කමිටුවේ මූලික කාර්යභාරය වන්නේ අභ්‍යන්තර හා බාහිර විගණනය, අභ්‍යන්තර මූල්‍ය පාලනය සහ මූල්‍ය වාර්තාකරණය යන ක්ෂේත්‍රවල වගකීම් අධීක්ෂණයේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමයි.

විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනා (03) ගෙන් සමන්විත වේ.

1. ඩබ්.එස්.කේ.ලියනගම මයා - සභාපති
(අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ව්‍යාපාර දෙපාර්තමේන්තුව )
2. එම්.එන්.එන්.සුජ්නා මිය - සාමාජික
(ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පාලන, ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශය )
3. වෛද්‍ය ලාල් ඒකනායක මයා සාමාජික
(අධ්‍යක්ෂ ජනරාල්, ජා.ක්‍රී. වෛද්‍යායතනය)

අධ්‍යක්ෂ ජනරාල්, ගණකාධිකාරී, පරිපාලන නිලධාරී සහ අනෙකුත් අදාල නිලධාරීන් මෙම රැස්වීම්වලට සහභාගී වීම අනිවාර්ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී සහ ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මෙම කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වේ.

විගණන කමිටුවේ කාර්යභාර්ය

පිරිසිදු ක්‍රීඩාවක් ස්ථාපිත කිරීම හා ආයතනය සතු වත්කම් ආරක්ෂා කරගැනීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වාගත යුතු ය. මුදල් අමාත්‍යාංශය සහ අදාළ බලධාරීන් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ ද කමිටුව විසින් අනුගමනය කරනු ලබයි. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී විගණන කමිටුව විසින් එහි ප්‍රධාන වගකීම්වලට අදාලව සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

1.අනුමත වාර්ෂික විගණන සැළැස්මට අනුකූල ව වරින්වර සිදුකරන ලද අභ්‍යන්තර විගණන පිළිබඳ කාලීන විගණන වාර්තා අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම අභ්‍යන්තර විගණන වාර්තා මගින් ආයතනයේ ක්‍රියාත්මක ව පවතින පද්ධති හා ක්‍රියාපටිපාටිවල ඇති අඩුපාඩු අවධාරණය කර පෙන්වා දෙන අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරු ව අවශ්‍ය අවස්ථාවන් හි පවතින ක්‍රමවේද හා කාර්ය පටිපාටිවල වැඩිදියුණු කිරීම් නිර්දේශ කර, කළමනාකරණ හා විගණන කමිටුවට ප්‍රගතිය වාර්තා කරයි. විගණන කමිටුවට අභ්‍යන්තර විගණනයෙන් නිසිපතා වාර්තා ලැබෙන අතර, එම කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද එක එක් විගණනය මගින් සොයා ගත් කරුණු පිළිබඳ සාරාංශයක් එම වාර්තාවලට ඇතුළත් වේ. කළමනාකරණයෙහි අදහස් ද එහි කොටසක් වන අතර, විගණනය විසින් නිරීක්ෂණය කර ඇති තත්වයන්ට හේතු වී ඇති මූලික කරුණු සහ එම තත්වයන්ට හේතු වී ඇති කරුණු සහ එම තත්වයන් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ද කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

2.අභ්‍යන්තර විගණනයේ හා රජයේ විගණනයේ සහය ඇති ව කමිටුව විසින් ආයතනයේ මෙහෙයුම් සහ මූල්‍ය පාලන සහ කාර්යපටිපාටිවල ඵලදායීතාවය තක්සේරු කරනු ලබන අතර, ඒවාට වියදම්, ආදායම් ක්‍රියාවලිය සහ ප්‍රාග්ධන වියදම් සඳහා අවසර දීමේ සීමා, අත්සන් කිරීමේ බලධාරීන්, තොරතුරු තාක්ෂණික යෙදවුම් පාලන හා සංවර්ධනය කිරීම, ආයතනික ව්‍යුහය, ප්‍රතිපත්ති, රාජකාරී වෙන් කර දීම සහ කළමනාකරණය විසින් සිදු කරනු ලබන සමාලෝචන ඇතුළත් වේ. ආයතනයෙහි මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ද්‍රවශීලතා තත්වය නිරන්තරයෙන් නිරීක්ෂණය කරන ලදි. එහි දී හඳුනා ගනු ලබන අඩු පාඩු අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා වන නිර්දේශ ද සහිතව වාර්තා කරනු ලැබේ.

පවත්වන ලද විගණන කමිටු රැස්වීම් ගණන

2024 වර්ෂය සඳහා රැස්වීම් තුනක් (03) පවත්වන ලද අතර ඒ සඳහා පැමිණීම පහත පරිදි වේ.

| විගණන කමිටුව | පැමිණීම | නොපැමිණීම |
|---|---|---|
| ඩබ්.එස්.කේ.ලියනගම මයා | 3/3 | නැත |
| එම්.එන්.එන්.සුජ්නා මිය | 3/3 | නැත |
| වෛද්‍ය ලාල් ඒකනායක මයා | 3/3 | නැත |
| බී. එල්.ඩී. බාලසූරිය මිය | 3/3 | නැත |
| ඩී.එච්.කලංසූරිය මිය | 2/3 | *1/3 |
| *එච්.එන්.එස්.පෙරේරා මිය (ඩී.එච්.කලංසූරිය මිය වෙනුවට) | 1/3 | - |

ඩබ්.එස්.කේ.ලියනගම
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව





# මූල්‍ය වාර්තා

මූල්‍ය තත්ව ප්‍රකාශය

විස්තීරණ ආදායම් ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

අවසාන ගිණුම් සඳහා සටහන්

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය

මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සටහන | 2024 දෙසැම්බර් 31 | 2023 දෙසැම්බර් 31 |
|---|---|---|---|
| | | (ශ්‍රී ලංකා රුපියල්) | |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 1 | 199,721,723.87 | 228,251,532.25 |
| | | **199,721,723.87** | **228,251,532.25** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 2 | 9,823,922.09 | 933,947.00 |
| අයවිය යුතු දෑ | 3 | 1,414,447.42 | 603,000.00 |
| කලින් ගෙවූ වියදම් | 4 | 93,477.24 | 1,677,665.12 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 5 | 5,755,362.26 | - |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 6 | 3,253,756.55 | 1,773,913.40 |
| | | **20,340,965.56** | **4,988,525.52** |
| **මුළු වත්කම්** | | **220,062,689.43** | **233,240,057.77** |
| අරමුදල් හා වගකීම් | | | |
| **මූල්‍යනය කළේ:** | | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | 7 | 171,330,102.43 | 188,029,846.83 |
| අනෙකුත් ප්‍රදාන | 8 | 3,302,464.38 | - |
| සමුච්ත අරමුදල | 9 | 13,668,777.25 | 13,801,400.64 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 10 | 23,502,228.35 | 23,502,228.35 |
| | | **211,803,572.41** | **225,333,475.82** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂිත වෙන් කිරීම් | 11 | **2,170,377.02** | **2,161,920.00** |
| **ජංගම් වගකීම්** | | | |
| ණයහිමියන් හා රඳවාගත් මුදල් | 12 | 2,746,469.83 | 2,106,217.80 |
| උපචිත වියදම් | 13 | 3,302,270.17 | 3,598,444.15 |
| ආපසු ගෙවියයුතු තැම්පතු | | 40,000.00 | 40,000.00 |
| | | **6,088,740.00** | **5,744,661.95** |
| | | **220,062,689.43** | **233,240,057.77** |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලද්දේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රමිතීන්ට අනුකූලවය.

………………………………………..
ඩී.කේ.ජේ.චතුරිකා
ගණකාධිකාරී

…………………………………...........
වෛද්‍ය එස්.එස්.පී.ද අල්විස්
අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබමි

.......……………………………
එම්.එන්.සුජ්නා
අධ්‍යක්ෂ

.......…………………………………
ආචාර්ය ඩී.එල්.කහටපිටිය
සභාපති

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**

**2024 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රකාශය**

| | සටහන | 2024 | 2023 |
|---|---|---|---|
| | | | **(ශ්‍රී ලංකා රුපියල්)** |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | 7 | 101,228,533.40 | 105,907,669.58 |
| අමාත්‍යාංශ ප්‍රතිපාදන | 8.1 | - | 691,964.51 |
| UNESCO ප්‍රතිපාදන | 8.2 | 310,000.00 | - |
| වෙනත් ආදායම් | 14 | 4,922,652.67 | 5,168,343.21 |
| **මුළු ආදායම්** | | **106,461,186.07** | **111,767,977.30** |
| පරිපාලන වියදම් | 15 | (101,228,533.40) | (106,599,634.09) |
| UNESCO වියදම් | 8.2 | (310,000.00) | - |
| **ශුද්ධ අතිරික්තය/( හිඟය)** | | **4,922,652.67** | **5,168,343.21** |

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**2024 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන | 2024 | 2023 |
|---|---|---|---|
| | | | **(ශ්‍රී ලංකා රුපියල්)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහයන්** | | | |
| ශුද්ධ ලාභය | | 4,922,652.67 | 5,168,343.21 |
| **ගැලපීම්** | | | |
| ක්ෂය | | 32,285,659.99 | 32,235,542.99 |
| සමුච්චිත ක්ෂයවීම් ඉවත් කිරීම | | (118,113.11) | - |
| සමුච්චිත ක්ෂයවීම් ඉවත් කිරීම(වත්කම් මාරු කිරීම් වලට අදාල) | | (16,200.00) | - |
| පෙර කාලපරිච්ඡේදයේ මුදල් නොවන ගැලපීම් | | (5,055,276.06) | - |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම් | 7 | (101,228,533.40) | (105,907,669.58) |
| UNESCO ප්‍රදානය සඳහා වෙන්කිරීම | 8.2 | (310,000.00) | - |
| | | **(69,519,809.91)** | **(68,503,783.38)** |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම්** | | | |
| (වැඩි කිරීම්)/අඩු කිරීම් තොගය | | (8,889,975.09) | 672,515.00 |
| (වැඩි කිරීම්)/අඩු කිරීම් අයවිය යුතු පරීක්ෂණ ගාස්තු | | (811,447.42) | 1,136,028.00 |
| (වැඩි කිරීම්)/අඩු කිරීම් කලින් ගෙවූ වියදම් | | 1,584,187.88 | (1,441,415.33) |
| වැඩි කිරීම්/ (අඩු කිරීම්) පාරිතෝෂික වෙන් කිරීම් | 11 | 8,457.02 | (419,449.53) |
| වැඩි කිරීම්/(අඩු කිරීම්) ගෙවිය යුතු දෑ හා රඳවුම් මුදල් | | 640,252.03 | (9,276,448.00) |
| වැඩි කිරීම්/(අඩු කිරීම්) උපචිත වියදම් | | (296,173.98) | 2,386,589.09 |
| | | **(7,764,699.56)** | **(6,942,180.77)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල්** | | **(77,284,509.47)** | **(75,445,964.15)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහ** | | | |
| දේපල පිරියත උපකරණ මිලදී ගැනීම් | | (3,769,033.75) | - |
| මුදල් නොවන ගැලපීම්: | | | |
| (+) දේපල පිරියත හා උපකරණ පරිභෝජන භාණ්ඩ කාණ්ඩයට මාරු කිරීම | | 19,450.00 | |
| (+) දේපල පිරියත හා උපකරණ විකිණීම | | 128,045.25 | |
| භාණ්ඩාගාර ප්‍රදාන පියවීම | | (1,804,211.00) | - |
| ස්ථාවර තැන්පතු වල ආයෝජනය | | (5,755,362.26) | - |
| | | **(11,181,111.76)** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | | 86,333,000.00 | 76,248,000.00 |
| UNESCO ප්‍රතිපාදන | | 3,612,464.38 | - |
| ලේකම් - ක්‍රීඩා අමාත්‍යාංශය | | - | (691,964.51) |
| | | **89,945,464.38** | **75,556,035.49** |
| **වර්ෂය තුළදී මෙහෙයුම් තුළින් ජනිත වූ ශුද්ධ ලාභය** | | **1,479,843.15** | **110,071.34** |
| **වර්ෂ ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **1,773,913.40** | **1,663,842.06** |
| **වර්ෂ අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **3,253,756.55** | **1,773,913.40** |

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**

**2024 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | භාණ්ඩාගාර ප්‍රතිපාදන | අමාත්‍යාංශ ප්‍රතිපාදන | අනෙකුත් ප්‍රතිපාදන | ප්‍රත්‍යාගණන සංචිතය | සමුච්චිත ලාභය | මුළු අගය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | රු. | රු. | රු. |
| **2020.01.01 දිනට ශේෂය** | **266,081,050.16** | **2,951,335.38** | **-** | **-** | **1,537,638.00** | **270,570,023.54** |
| වසර තුළ අතිරේක | 71,711,000.00 | - | - | - | - | 71,711,000.00 |
| අරමුදල් ක්‍රමක්ෂය හා භාණ්ඩාගාර පියවීම් | (71,562,628.27) | (753,122.50) | - | - | - | (72,315,750.77) |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | - | - | - | 2,927,395.91 | 2,927,395.91 |
| ප්‍රත්‍යාගණන සංචිතය | - | - | - | 2,547,085.96 | - | 2,547,085.96 |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය-සංශෝධිත** | **266,229,421.89** | **2,198,212.88** | **-** | **2,547,085.96** | **4,465,033.91** | **275,439,754.64** |
| වසර තුළ අතිරේක | 50,056,000.00 | - | - | - | - | 50,056,000.00 |
| අරමුදල් ක්‍රමක්ෂය | (64,474,387.26) | (753,122.50) | - | - | - | (65,227,509.76) |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | - | - | - | 1,849,020.00 | 1,849,020.00 |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **251,811,034.63** | **1,445,090.38** | **-** | **2,547,085.96** | **6,314,053.91** | **262,117,264.88** |
| වසර තුළ අතිරේක | 58,616,000.00 | - | - | - | - | 58,616,000.00 |
| අරමුදල් ක්‍රමක්ෂය | (92,737,518.22) | (753,125.87) | - | - | - | (93,490,644.09) |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | - | - | - | 2,319,003.52 | 2,319,003.52 |
| ප්‍රත්‍යාගණන සංචිතය | - | - | - | 20,955,142.39 | - | 20,955,142.39 |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **217,689,516.41** | **691,964.51** | **-** | **23,502,228.35** | **8,633,057.43** | **250,516,766.70** |
| වසර තුළ අතිරේක | 76,248,000.00 | - | - | - | - | 76,248,000.00 |
| අරමුදල් ක්‍රමක්ෂය | (105,907,669.58) | (691,964.51) | - | - | - | (106,599,634.09) |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | - | - | - | 5,168,343.21 | 5,168,343.21 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **188,029,846.83** | **-** | **-** | **23,502,228.35** | **13,801,400.64** | **225,333,475.82** |
| වසර තුළ අතිරේක | 86,333,000.00 | - | 3,612,464.38 | - | - | 89,945,464.38 |
| අරමුදල් ක්‍රමක්ෂය හා භාණ්ඩාගාර පියවීම් | (103,032,744.40) | - | (310,000.00) | - | - | (103,342,744.40) |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | - | - | - | 4,922,652.67 | 4,922,652.67 |
| පෙර කාල පරිච්ඡේද ගැලපීම් | - | - | - | - | (5,055,276.06) | (5,055,276.06) |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **171,330,102.43** | **-** | **3,302,464.38** | **23,502,228.35** | **13,668,777.25** | **211,803,572.41** |

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**2024 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්**

## 1. වාර්ථා කිරීමේ අස්ථිත්‍යය

### 1.1 පොදු

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය 2013 නොවැම්බර් මස 11 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද 2013 අංක 33 දරණ උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතට අනුව ස්ථාපිත කරන ලදී. මෙම ආයතනයේ ලියාපදිංචි කාර්යාලය අංක 363/12, සුගතදාස ස්මේඩියම් - බ්ලොක් ඩී, ස්ටේඩියම් රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14 යන ලිපිනයේ පිහිටුවා ඇත.

### 1.1 .1 ආයතනයේ අරමුණු

a) ක්‍රිඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිටුදැකීම සඳහා අවශ්‍ය වන යම් පියවර ගැනීම.
b) ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම සම්බන්ධ ක්ෂේත්‍ර හා අදාළ පර්යේෂණ සහ නියෝජ්‍යායතනය සහ සමාන කර්තව්‍ය ඉටු කරනු ලබන වෙනත් අන්තර්ජාතික සංවිධාන අතර අන්‍යොන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

### 1.1.2. ප්‍රකාශණ අනුකූලතාවය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ ගිණුම් සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලවය.

### 1.1.3. සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ඓතිහාසික පිරවැය පදනම යටතේය. මෙහිදී උද්ධමනීය සාධක සැලකිල්ලට ගනු නොලබයි.

### 1.1.4. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.

ශේෂපත්‍ර දිනට පසුව වියහැකි ප්‍රධාන ප්‍රතිවිපාක සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල හා ගිණුම් වල අනාවරණය කරනු ලබයි.

### 1.2. වත්කම් සහ අගය කිරීමේ පදනම

වර්ෂයක් තුළ මුදල් සහ බැංකු ශේෂය සහ මුදල් වලට පරිවර්ථනය කළ හැකි අයිතම සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ ජංගම වත්කම් ලෙස හඳුනාගෙන ශේෂ පත්‍රයේ විස්තර කර ඇත.

### 1.2.1 වත්කම්

දේපල පිරියත සහ උපකරණ වල අගය දක්වා ඇත්තේ සමුච්ත ක්ෂය අඩු කිරීමෙන් පසුවය

**1.2.2 ක්ෂය**

ක්ෂය ප්‍රතිපත්තිය සිදු කර ඇත්තේ සරළ මාර්ග ක්‍රමයටය. ක්ෂය කරනු ලබන්නේ වත්කම් අත්පත් කරගත් වර්ෂයේ සිට හෝ අදාළ වත්කමේ ඉදිකිරීම් කටයුතු අවසන් වූ වර්ෂයේ සිටය. වත්කමේ අපේක්ෂිත ඵලදායී ජීවකාලය තුළ ආදායම් සහ වියදම් ගිණුමෙන් ක්ෂය කපා හැරීම.

- පරිඝණක සහ උපකරණ 25%
- ගෘහ උපකරණ 10%
- වෙනත් උපකරණ 25%
- මෝටර් වාහන 12.5%
- පර්යේෂණ උපකරණ 25%
- රසායනාගාර ගෘහ උපකරණ 10%
- ගොඩනැගිලි 5%

**1.2.3 තොග**

වසර අවසාන තොගය ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 9, ඡේද 16 ට අනුකූලව තක්සේරු කර ඇති අතර, හුවමාරු නොවන ගනුදෙනුවක් මාර්ගයෙන් තොග අත්පත් කරගත් අවස්තාවලදී ඒවායේ පිරිවැය ඒවා අත්පත් කරගත් දින පැවති සාධාරණ අගයට මනිනු ලැබේ. තොගවල සාධාරණ අගය/ ගැනුම් පිරිවැය (අ) ගැනුම් මිල, (ආ) ආනයන තීරු බදු සහ අනෙකුත් බදු සහ (ඇ) ප්‍රවාහන වියදම් හා පරිහරණ ගාස්තු සහ නිමි භාණ්ඩ අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාල වන අනෙකුත් පිරිවැය වලින් සමන්විතවේ. ආයතනයේ තොග පහත පරිදි වේ.

- මානව මුත්‍රා සාම්පල් කට්ටල
- අශ්ව මුත්‍රා සාම්පල කට්ටල
- රුධිර සාම්පල කට්ටල
- ලිපිද්‍රව්‍ය
- ටෝනර් සහ කාට්රිජ්
- පර්යේෂණ රසායනාගාර උපකරණ

**1.3.** මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හදුනාගත් සියළුම වගකීම් ගිණුම්ගත කර ඇත.ශේෂපත්‍ර දින සිට වර්ෂයක් තුළ ගෙවිය හැකි හෝ ඉල්ලීමක් මත ගෙවිය හැකි වගකීම් ජංගම වගකීම් ලෙස ශේෂ පත්‍රයේ හදුනාගෙන ඇත.ගෙවීම සඳහා වර්ෂයකට වැඩි කාලයක් ගත වන වගකීම් ජංගම නොවන වගකීම් වේ.

**1.3.1 සේවකයන්ගේ හිමිකම්.**

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවා නියුකිතිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා දායකත්වය මූල්‍ය ප්‍රකාශනයේ වියදම් ලෙස හදුනාගෙන ඇත.

**1.3.2. සේවකයන් සඳහා විශ්‍රාම පාරිතෝෂිත**

සෑම සේවකයෙකු සේවයෙහි යෙදී පළමු වර්ෂය අවසන් වූ පසුව විශ්‍රාම පාරිතෝෂික වෙන් කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත. 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව මෙය සිදු කරනු ලබයි. සෑම වර්ෂයකම දෙසැම්බර් මස අවසාන දිනට ඇති කාර්යය මණ්ඩලයේ දළ වැටුපෙන් භාගයක් පාරිතෝෂිත සඳහා වෙන් කරනු ලබයි. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව මෙම ගෙවීම සිදු කරනු ලබන්නේ වසර 5 ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කරන ලද සේවකයින්ට පමණි.

**1.4. ආදායම් ප්‍රකාශය**

**1.4.1 ආදායම්**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලවය අදාළ සේවාව ලබා දීමෙන් පසුව උපචිත පදනම මත ආදායම හඳුනාගනී.

**1.4.2 වියදම්**

වියදම් පිළිබඳ විස්තරයෙහි ලාභය හෝ අලාභය හඳුනාගන්නේ බදු අයකිරීමට පෙර හා හඳුනාගත් සියළු වගකීම් සඳහා වෙන්කිරීමෙන් පසුවය.

වත්කම් නඩත්තු කිරීමේ හා ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී දැරීමට වන වියදම් ශුද්ධ ඌනතාවය හෝ අතිරික්තය ගණනය කිරීමේ දී ආදායම් පිළිබඳ විස්තර වල ගලපනු ඇත.දුරකතන වියදම්, විදුලි වියදම් හා ජල බිල්පත් එම පහසුකම් සඳහා හිමිකම් කියන නිළධාරීන් හා සේවකයවන්ගෙන් අයකරනු ලබයි. එම වියදම් අදාල තීරු හි විස්තර කරනු ලබයි.

**1.4.3 ප්‍රතිපාදන**

ප්‍රතිපාදන හා ආධාර අදාල වියදම් සඳහා ගැලපෙන අයුරින් සකස් කර ඇත. වත්කම් හා සම්බන්ධ මූල්‍ය නොවන ප්‍රතිපාදන, මූල්‍ය වටිනාකම මත ගිණුම්ගත කල යුතු අතර එම වත්කම් ආදායම් ප්‍රකාශයේ වත්කමේ ඵලදායි ජීව කාලය තුල කපා හරිනු ඇත.

**1.4.4 අනෙකුත් ප්‍රතිපාදන**

අනෙකුත් ප්‍රතිපාදන සහ ආධාර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස ගිණුම්ගත කල යුතු අතර, වැඩසටහන අවසානයේ ඇති යම් මුදලක් තිබේ නම්, එය වෙනත් ආදායමක් ලෙස ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

**1.5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**1.5.1 මුදල්**

අතැති මුදල් හා ඉහළ ද්‍රවශීලතාවක් සහිත කිසිදු අවධානමකින් තොරව පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි වත්කම් මුදල් ලෙස හඳුනා ගනී. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවශ්‍යතාවය මත අතැති මුදල් හා බැංකු මුදල්, මුදල් ලෙස හඳුනා ගැනේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනුයේ වක්‍ර පදනමටය.

**1.5.2 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.**

ශේෂපත්‍ර දිනට පසුව වියහැකි ප්‍රධාන ප්‍රතිවිපාක සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල හා ගිණුම් වල අනාවරණය කරනු ලබයි.

**1.6. ඉකුත් කාල පරිච්ඡේද වල වැරදි හෙළිදරව් කිරීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) 3 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි වලට අනුකූලව ආයතනය පෙර කාල පරිච්ඡේදවල ප්‍රමාණාත්මක වැරදි හඳුනාගෙන නිවැරදි කරයි. SLPSAS 3 ට අනුකූලව, ප්‍රමාණාත්මක පෙර කාල පරිච්ඡේද වැරදි, ඒවා

සොයා ගැනීමෙන් පසු නිකුත් කිරීමට අවසර දී ඇති පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ පසුකාලීනව නිවැරදි කරනු ලැබේ:

1. වරද සිදුවූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් හෝ
2. ඉදිරිපත් කරනු ලබන පැරණිම කාල පරිච්ඡේදයට පෙර වරද සිදුවූයේ නම්, එම පැරණිම කාල පරිච්ඡේදයේ වත්කම්, වගකීම් සහ ශුද්ධ වත්කම් වල/ ස්කන්ධයන්හි ආරම්භක ශේෂයෙන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතුය

පෙර කාලපරිච්ඡේදයේ සිදු වූ සැලකිය යුතු නොවන වැරදි සඳහා, පෙර වර්ෂයේ අගයන් සංශෝධනය නොකර වත්මන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කරනු ලැබේ.

**2024 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**සටහන 01**
**දේපල පිරියත සහ උපකරණ**
**(ශ්‍රී ලංකා රුපියල්)**

| පිරිවැය/ ප්‍රත්‍යාගණිත | 2024.01.01 දිනට ශේෂය | වර්ෂයේ එකතු කිරීම් | වර්ෂයේ අඩු කිරීම් | මාරු කිරීම් | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ සැලසුම් | 217,189,969.57 | 242,991.00 | 7,560.00 | - | 217,425,400.57 |
| ගෘහ භාණ්ඩ | 873,436.35 | 499,657.50 | 114,485.25 | - | 1,258,608.60 |
| පරිඝණක සහ උපකරණ | 3,105,934.27 | 1,595,737.60 | - | 19,450.00 | 4,682,221.87 |
| වෙනත් උපකරණ | 2,416,000.00 | 197,866.25 | 6,000.00 | - | 2,607,866.25 |
| රථ වාහන | 6,024,980.00 | - | - | - | 6,024,980.00 |
| පර්යේෂණ උපකරණ | 69,869,800.00 | 1,232,781.40 | - | - | 71,102,581.40 |
| රසායනාගාර ගෘහ උපකරණ | 16,876,414.30 | - | - | - | 16,876,414.30 |
| | **316,356,534.49** | **3,769,033.75** | **128,045.25** | **19,450.00** | **319,978,072.99** |

| සමුච්ත ක්ෂය | 2024.01.01 දිනට ශේෂය | වර්ෂයේ එකතු කිරීම් | වර්ෂයේ අඩු කිරීම් | මාරු කිරීම් | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ සැලසුම් | 54,049,342.72 | 10,862,282.48 | 1,890.00 | - | 64,909,735.20 |
| ගෘහ භාණ්ඩ | 780,760.29 | 63,801.02 | 111,723.11 | - | 732,838.20 |
| පරිඝණක සහ උපකරණ | 2,237,912.14 | 823,959.07 | - | 16,200.00 | 3,045,671.21 |
| වෙනත් උපකරණ | 1,795,662.50 | 617,834.00 | 4,500.00 | - | 2,408,996.50 |
| රථ වාහන | 5,023,308.87 | 753,122.00 | - | - | 5,776,430.87 |
| පර්යේෂණ උපකරණ | 17,467,450.00 | 17,477,020.00 | - | - | 34,944,470.00 |
| රසායනාගාර ගෘහ උපකරණ | 6,750,565.72 | 1,687,641.43 | - | - | 8,438,207.15 |
| | **88,105,002.24** | **32,285,659.99** | **118,113.11** | **16,200.00** | **120,256,349.12** |
| **2024.12.31 දිනට ලේඛණගත අගය** | **228,251,532.25** | **(28,516,626.24)** | **9,932.14** | **3,250.00** | **199,721,723.87** |

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**2024 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| | 2024 | 2023 |
|---|---|---|
| **සටහන-02** | | |
| **තොග** | | |
| මානව මූත්‍ර සාම්පල් කට්ටල | 4,183,177.00 | 232,000.00 |
| සත්ව මූත්‍ර සාම්පල් කට්ටල | 487,110.00 | - |
| රුධිර සාම්පල් කට්ටල | 666,985.00 | - |
| ලිපිද්‍රව්‍ය | 370,352.00 | 299,130.00 |
| ටෝනර් සහ කාට්රිජ් | 412,760.10 | 402,817.00 |
| පර්යේෂණ රසායනාගාර උපකරණ | 3,703,537.99 | |
| | **9,823,922.09** | **933,947.00** |
| **සටහන-03** | | |
| **අයවියයුතු දෑ** | | |
| පරීක්ෂණ ආදායම් - ශ්‍රී ලංකා ක්‍රිකට් මණ්ඩලය | 1,380,000.00 | - |
| ලැබිය යුතු මුදල් - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | - | 603,000.00 |
| ලැබිය යුතු පොළී | 34,447.42 | - |
| | **1,414,447.42** | **603,000.00** |
| **සටහන-04** | | |
| **කලින් ගෙවූ වියදම්** | | |
| ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් (පුද්) සමාගම | 9,173.14 | 11,965.75 |
| මෙට්‍රොපොලිටන් ඔෆිස් (පුද්) සමාගම | - | 3,354.17 |
| ඔෆිස්ට්‍රොනික්ස් (පුද්) සමාගම | 15,005.56 | 15,416.67 |
| හේලීස් ඇවෙන්චුරා (පුද්) සමාගම | 32,811.87 | 24,332.08 |
| ඔෆිස් නෙට්වර්ක් (පුද්) සමාගම | 4,720.00 | 415.89 |
| ඇඩ්වාන්ස් මයික්‍රෝ ටෙක්නොලොජි | 29,500.00 | - |
| ග්‍රීන් පෙස්ට් කන්ට්‍රෝල් | 2,266.67 | - |
| අත්තිකාරම් ගෙවීම - Lockcon AG | - | 1,622,180.56 |
| | **93,477.24** | **1,677,665.12** |
| **සටහන-05** | | |
| අනෙකුත් මූල්‍ය වත්කම් | | |
| ස්ථාවර තැන්පතු – 000093147985 | 1,430,362.26 | - |
| ස්ථාවර තැන්පතු – 000093246034 | 2,600,000.00 | - |
| ස්ථාවර තැන්පතු - 000093463206 | 1,725,000.00 | - |
| | **5,755,362.26** | **-** |

| | 2024 | 2023 |
|---|---|---|
| **සටහන-06** | | |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ** | | |
| ලංකා බැංකුව - ගිණුම් අංක 75463697 | 3,253,756.55 | 1,773,913.40 |
| | **3,253,756.55** | **1,773,913.40** |

**සටහන-07**

**භාණ්ඩාගාර ප්‍රතිපාදන**

| | | |
|---|---|---|
| ආරම්භක වර්ෂයේ ශේෂය | 188,029,846.83 | 217,689,516.41 |
| ගලා ඒම් | 86,333,000.00 | 76,248,000.00 |
| භාණ්ඩාගාරයට පියවීම් | (1,804,211.00) | - |
| | 272,558,635.83 | 293,937,516.41 |
| අරමුදල් ක්‍රමක්ෂය | (101,228,533.40) | (105,907,669.58) |
| වර්ෂ අවසානයේ ශේෂය | **171,330,102.43** | **188,029,846.83** |

**සටහන-08**

**වෙනත් ප්‍රදාන**

**8.1** අමාත්‍යාංශ ප්‍රතිපාදන

| | | |
|---|---|---|
| ආරම්භක වර්ෂයේ ශේෂය | - | 691,964.51 |
| අරමුදල් ක්‍රමක්ෂය | - | (691,964.51) |
| වර්ෂ අවසානයේ ශේෂය | **-** | **-** |

**8.2 UNESCO** ප්‍රදාන

| | | |
|---|---|---|
| ප්‍රදාන ලැබීම් | 3,612,464.38 | - |
| අරමුදල් ක්‍රමක්ෂය | (310,000.00) | - |
| වර්ෂ අවසානයේ ශේෂය | 3,302,464.38 | - |

**සටහන-09**

**සමුච්චිත අරමුදල**

| | | |
|---|---|---|
| ආරම්භක වර්ෂයේ ශේෂය | 13,801,400.64 | 8,633,057.43 |
| <u>පෙර කාල පරිච්ඡේද ගැලපීම</u> | | |
| (i) ගෙවිය යුතු ගිණුම් වැරදි නිවැරදි කිරීම | (5,008,803.92) | - |
| (ii) ආරම්භක සාම්පල් කට්ටල තොග ගණන වැරදි නිවැරදි කිරීම | (36,540.00) | - |
| (iii) වත්කම් බැහැර කිරීමේදී සිදුවූ වැරදි නිවැරදි කිරීම | (9,932.14) | |
| ගලපන ලද සමුච්චිත අරමුදල් ශේෂය | 8,746,124.58 | 8,633,057.43 |
| මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රකාශනයෙන් මාරු කරන ලද අතිරික්තය | 4,922,652.67 | 5,168,343.21 |
| වර්ෂ අවසානයේ ශේෂය | **13,668,777.25** | **13,801,400.64** |

(i) 2019 වර්ෂයේ සිදු කළ රු. 5,008,803.92 ක උපදේශන වියදමක් එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පළ කර නොමැති බව 2024 වර්ෂයේදී හඳුනා ගන්නා ලදි. එනිසා, මෙම වියදම 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීම සඳහා පෙර කාල පරිච්ඡේද ගැලපීම සිදු කර ඇත. 2024 ජනවාරි 1 වන දිනට සමුච්චිත අරමුදලේ ආරම්භක ශේෂය රු. 5,008,803.92 කින් අඩු කර ඇති අතර එමඟින් වැරදි නිවැරදි කිරීම පිළිබිඹු වේ.

(ii) වටිනාකමින් රු. 36,540ක් වන කල් ඉකුත් වූ සත්ව මුත්‍රා සාම්පල කට්ටල (ප්‍රමාණය: 6) ඇතුළත් කිරීම හේතුවෙන් 2023 අවසන් තොගයේ රු. 36,540 කින් අධි තක්සේරු වීමක් සිදුවී ඇත. ඒවා කල් ඉකුත් වීම හේතුවෙන් 2021 ගිණුම්වලින් ඉවත් කරන ලද නමුත් 2023 සඳහා යළි මානව සාම්පල කට්ටල තොගයට වැරදි ලෙස ඇතුළත් කර ඇත.

(iii) ස්ථාවර වත්කම් ලේඛනය සමාලෝචනය කිරීමේදී පෙර වසරවල විකුණන ලද, ආපසු ලබා දුන් හෝ විනාශ කරන ලද නමුත් තවමත් පොත්වල සටහන් කර ඇති වත්කම් කිහිපයක් හඳුනා ගන්නා ලදී. මීට අමතරව, සමහර

වත්කම් සඳහා ඒවායේ බැහැර කිරීමේ වසරවලින් ඔබ්බට වැරදි ලෙස ක්ෂය වීම් සිදුව ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම දෝෂ නිවැරදි කිරීම සඳහා ගැලපීම් සිදු කරන ලද අතර, එමඟින් රු. 9,932.14 ක මුළු පූර්ව-කාල ගැලපීමක් සිදු වූ අතර එය සමුච්චිත අරමුදලට හර කරන ලදී..

**සටහන-10**

**ප්‍රත්‍යාගණන සංචිත**

| | | |
|---|---|---|
| ආරම්භක වර්ෂයේ ශේෂය | 23,502,228.35 | 23,502,228.35 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - |
| වර්ෂ අවසානයේ ශේෂය | **23,502,228.35** | **23,502,228.35** |

**සටහන-11**

**පාරිතෝෂිත වෙන් කිරීම්**

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ වෙන් කිරීම | 2,161,920.00 | 2,581,369.53 |
| වසර සඳහා පාරිතෝෂිත ගෙවීම | (216,495.00) | (685,155.00) |
| වර්ෂයේ වෙන් කිරීම | 224,952.02 | 265,705.47 |
| වර්ෂ අවසානයේ වෙන් කිරීම | **2,170,377.02** | **2,161,920.00** |

**සටහන-12**

**ණයහිමි හා රැඳවුම් ගිණුම්**

| | | |
|---|---|---|
| ඇනලටිකල් ඉන්ස්ටෘමන්ට්ස් | 472,915.80 | 472,915.80 |
| Anti-Doping Lab Qatar | - | 1,633,302.00 |
| මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාලය(CECB) | 2,273,554.03 | - |
| | **2,746,469.83** | **2,106,217.80** |

**සටහන-13**

**උපචිත වියදම්**

| | | |
|---|---|---|
| ආරම්භක වර්ෂයේ ශේෂය | 170,000.00 | 140,000.00 |
| තැපල් සහ සන්නිවේදන | 28,034.58 | 31,130.09 |
| විදුලිය සහ ජල වියදම් | 428,884.03 | 466,915.46 |
| මෙහෙයුම් කල්බදු - ලීසිං කුලිය | 238,000.00 | 238,000.00 |
| වැටුප් හා වේතන | 67,058.39 | 17,225.00 |
| අතිකාල දීමනා වියදම් | 56,369.77 | 55,173.92 |
| ප්‍රවාහන වියදම් | 124,000.00 | 124,000.00 |
| ආරක්ෂක සේවා | 401,442.05 | 318,107.69 |
| පවිත්‍රතා සහ සනීපාරක්ෂක සේවා | 173,350.00 | 162,800.00 |
| විගණන ගාස්තු | 172,000.00 | 170,000.00 |
| තහනම් උත්තේජක පරීක්ෂණ වියදම් | 1,223,484.83 | 1,443,459.60 |
| වාහන නඩත්තු වියදම් | - | 197,350.00 |
| යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | 106,938.09 | 79,453.95 |
| ප්‍රකාශනය සහ ප්‍රවර්ධනය | 3,200.00 | 2,620.00 |
| අනෙකුත් වියදම් | - | 4,145.00 |
| පර්යේෂණ සහ සංවර්ධන | - | 122,337.18 |
| ගෙවිය යුතු උ.වි.ගෙ.බදු | 6,333.43 | 25,726.26 |
| සේවා ගිවිසුම | 103,175.00 | - |
| | **3,302,270.17** | **3,598,444.15** |

| සටහන-14 | 2024 | 2023 |
|---|---|---|
| **වෙනත් ආදායම්** | | |
| උත්තේජක පරීක්ෂණ ආදායම් | 3,360,805.45 | 2,939,478.10 |
| අධ්‍යාපන වැඩමුළු ආදායම | 750,000.00 | - |
| පයේෂණාගාර ඉපයීම | 249,220.00 | - |
| යලි නොගෙවන තැම්පතු | 30,000.00 | 15,000.00 |
| කුලී ආදායම් | 62,850.00 | 72,000.00 |
| වෙනත් ආදායම් | 175,707.85 | 837,862.00 |
| විදේශ විනිමය ලාභ | 166,486.86 | 1,304,003.11 |
| ස්ථාවර තැන්පතු පොළී | 127,575.51 | - |
| වත්කම් විකිණීමෙන් ලද ලාභ | 7.00 | - |
| | **4,922,652.67** | **5,168,343.21** |

| සටහන-15 | | |
|---|---|---|
| **පරිපාලන වියදම්** | | |
| වැටුප් හා වේතන | 16,104,582.61 | 13,279,616.26 |
| අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | 737,830.25 | 485,367.83 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,404,477.59 | 1,214,671.05 |
| සේවක නියුක්තිකයේ භාරකාර අරමුදල | 351,119.42 | 303,667.76 |
| ගෘහස්ථ, ප්‍රවාහන සහ ඉන්ධන දීමනා | 50,819.54 | 305,582.66 |
| විදේශීය ගමන් වියදම් | 349,557.41 | 1,534,535.68 |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල උපකරණ | 797,607.90 | 883,017.56 |
| ඉන්ධන | 1,492,592.00 | 1,900,389.30 |
| නිල ඇඳුම් | 12,000.00 | - |
| වාහන නඩත්තු වියදම් | 219,595.00 | 624,110.60 |
| ගොඩනැගිලි සහ සැලසුම් නඩත්තු වියදම් | 1,106,707.20 | 224,945.70 |
| යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | 702,864.37 | 1,648,614.87 |
| මෘදුකාංග නඩත්තු වියදම් | 96,099.45 | - |
| ප්‍රවාහන | 1,488,000.00 | 1,246,090.00 |
| වාහන කුලී ගාස්තු | 2,856,000.00 | 2,552,309.50 |
| තැපල් සහ සන්නිවේදන | 420,490.13 | 551,553.65 |
| විදුලිය සහ ජලය | 5,375,259.57 | 5,033,205.53 |
| සේවා ගිවිසුම් ගාස්තු | 1,115,194.90 | - |
| වාහන රක්ෂණ ගාස්තු | 166,170.72 | - |
| තහනම් උත්තේජක පරීක්ෂණ ගාස්තු | 11,165,118.93 | 11,160,508.23 |
| ප්‍රවර්ධනය හා ප්‍රචාරණ ගාස්තු | 464,050.00 | 1,368,384.00 |
| රැස්වීම් වියදම් | 725,153.76 | 1,202,412.00 |
| සාමාජිකත්වය අළුත් කර ගැනීමේ වියදම් | 5,874,047.16 | 5,965,930.23 |
| විගණන ගාස්තු | 190,592.00 | 170,000.00 |
| ධාරිතාව සංවර්ධන | 313,124.50 | 1,027,242.00 |
| ක්ෂය වීම් | 32,285,659.99 | 32,235,542.99 |
| රඳවාගැනීමේ බදු | 6,378.78 | - |
| පාරිතෝෂිත වියදම් | 224,952.02 | 265,705.47 |
| පවිත්‍රතා සහ සනීපාරක්ෂක සේවා | 1,878,600.00 | 2,015,700.00 |
| ආරක්ෂක සේවා | 4,221,132.28 | 3,586,346.75 |
| අනෙකුත් වියදම් | 123,243.00 | 167,830.90 |

| | | |
|---|---|---|
| තහනම් උත්තේජක සම්බන්ධ අධ්‍යාපනය | 904,271.00 | 489,915.46 |
| තහනම් උත්තේජක- බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම | 1,438,222.47 | 913,588.00 |
| පර්යේෂණ හා සංවර්ධන | 4,831,100.48 | 2,580,291.31 |
| නීතිමය සහ බලාත්මක කිරීමේ වියදම් | 248,545.48 | 274,276.87 |
| පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදම්- ගොඩනැගිලි | 149,132.19 | - |
| පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදම්- යන්ත්‍රෝපකරණ | 854,205.30 | 260,929.25 |
| පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදම්- වාහන | 465,536.00 | 445,500.00 |
| සූර්ය පැනල සවි කිරීම | 18,500.00 | - |
| ආසියානු/ ශාන්තිකර කලාපීය අමාත්‍ය මණ්ඩල සමුළුව | - | 10,681,852.68 |
| | 101,228,533.40 | 106,599,634.09 |

මගේ අංකය / எனது இல. / My No. SYA/C/SLADA/01/24/02 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 අගෝස්තු 11 දින

සභාපති

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ("නියෝජ්‍යායතනය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත හා 1971 අංක 38 දරන මුදල් පනත සහ 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 30 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 නියෝජ්‍යායතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් නියෝජ්‍යායතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජ්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය නියෝජ්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජ්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජ්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා නියෝජ්‍යායතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6.(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට නියෝජ්‍යායතනයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.4 (viii) වගන්තිය | සේවක පුරප්පාඩුවක් ඇතිවූ විට එම තනතුරේ වැඩ බැලීම සඳහා අවිනිශ්චිත කාලයක් වෙනුවෙන් වැඩබලන පදනම මත බඳවා නොගත යුතු වුවද, නියෝජ්‍යායතනය විසින් අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම) තනතුර සඳහා 2023 පෙබරවාරි 28 දින සිට කාල වකවානුවක් |

සඳහන් නොකර වැඩබැලීමේ පත්වීමක් ලබාදී තිබුණි. ඒ වෙනුවෙන් 2025 ජූලි මස වන විට රු. 568,733 ක් වැඩ බැලීමේ දීමනා ලෙස ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන් පනතේ 12 (ළු) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ. බ.)

# කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවේ කරුණු වලට ආයතනයේ කළමනාකරීත්වයේ යෝජිත පියවරයන් පහත පරිදි වේ.**

**1. කරුණ- නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

සේවක පුරප්පාඩුවක් ඇතිවූ විට එම තනතුරේ වැඩ බැලීම සඳහා අවිනිශ්චිත කාලයක් වෙනුවෙන් වැඩ බලන පදනම මත බඳවා නොගත වුවද, නියෝජ්‍යායතනය විසින් අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම) තනතුර සඳහා 2023.02.28 වන දින සිට කාලවකවානුවක් සඳහන් නොකර වැඩ බැලීමේ පත්වීමක් ලබා දී තිබුනි. ඒ වෙනුවෙන් 2025 ජූලි මස වන විට රු. 568,733.00 ක් වැඩ බැලීමේ දීමනා ලෙස ගෙවා තිබුණි.

**කළමනාකාරීත්වයේ අදහස:**

නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම) තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරන ලද බඳවා ගැනීමේ ක්‍රියාවලියට අනුව සුදුසුකම් සහිත අයදුම්කරුවකු බඳවා ගැනීමේ දැඩි උත්සාහයක් (පුවත්පත් දැන්වීම් ඇතුළු) සිදු කළ ද 2023 වර්ෂය දක්වා එම තනතුර සඳහා පත්වීමක් සිදු කළ නොහැකි විය.

එම නිසා එම තනතුර හිස් වීමෙන් බලාත්මක හා ක්‍රියාත්මක කිරීම් කාර්යයන් අපේක්ෂිත සිදු ලෙස කිරීමට බාධා මතු විය. එම අර්බුදය විසඳීම සඳහා 2022 වසරේ පළමු කාර්තුමය කළමනාකරණ රැස්වීමේදී ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලයට නොඅඩු ශ්‍රී ලංකා පොලිස් සෙවයේ නිලධාරියකු (විශේෂයෙන් ම මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ අත්දැකීම් සහිත) ලබා ගැනිමට යෝජනා විය.

ඒ අනුව ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මගින් 2022.09.22 වන දින මහජන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කළ ඉල්ලීමකට අනුව එම පුරප්පාඩුව සඳහා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකු වන පි.ජී. දර්ශන මහතා වැඩ බැලීමේ පදනම මත පත් කරන ලදී. මෙම පත්වීම රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 9 වගන්තිය ප්‍රකාරව අවුරුද්දක කාලසීමාවක් සඳහා පත් කළ යුතු වුවද පත්වීම් ලිපියේ සඳහන් කර ඇත්තේ තාවකාලික වැඩ බැලීමේ පදනම යනුවෙනි. ඒ අනුව මෙම පත්වීම තාවකාලිකව සිදුකර ඇති වැඩ බැලීමේ පත්වීමක් බවත් ඕනෑම අවස්ථාවක ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට මෙම නිලධාරියාගේ සේවයන් අවසන් කර දැමීමට හැකියාව පවතින බවත් සඳහන් කළ යුතුවේ.

කෙසේ වෙතත් මෙම පත්වීම සම්බන්ධයෙන් දිගින් දිගටම විගණන කමිටු රැස්වීම්වලදී පෙන්වා දුන් බැවින් මේ පිළිබඳව 2025.07.24 වන දිනැති නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මගින් යොමු කර ඇත. ඒ අනුව මෙම නිලධාරියාගේ සේවය තවදුරටත් ආයතනයට අවශ්‍ය බවත් එය ලබා ගත යුතු බවත් යෝජනා කළ අතර පත්වීම් ලිපියෙහි කාලසීමාවක් සඳහන් කර නොමැති බැවින් මෙම නිලධාරියාගේ සේවය නියෝජ්‍යායතනයේ අභිමතය මත තවදුරටත් ලබා ගතහැකිද? නිල කාලසීමාව දීර්ඝ කළ හැකිද? එසේත් නොමැති නම් ඒ සඳහා වෙනත් සුදුසු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකු පත් කරන ලෙසත් ලේකම් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය මගින් ලේකම් මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් විමසන ලෙස දන්වා ඇත. ඒ අනුව 2025.07.31 වන දින අධ්‍යක්ෂ බලාත්මක කිරීම් හා ක්‍රියාත්මක කිරීම් තනතුරේ වැඩ බැලීමේ කාලසීමාව සම්බන්ධව ලේකම් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය මගින් ලේකම් මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත කරුණු විමසීමේ ලිපියක් යොමු කර ඇත ඒ සඳහා තවමත් පිළිතුරක් ලැබී නොමැත.